ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ

දසවැනි පාර්ලිමේන්තුවේ

පළමුවැනි සභාවාරය

**පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක 491**

# රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ

# අටවැනි වාර්තාව

(ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව සම්බන්ධයෙන් 2025.05.09, 2025.06.05 සහ 2025.11.27 යන දිනයන්හිදී සිදු කරන ලද විමර්ශන)

රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ සභාපති
පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු කබීර් හෂීම් මහතා විසින්
2026 මාර්තු මස 06 වැනි දින ඉදිරිපත් කරන ලදී.

*2026 මාර්තු මස 06 වැනි දින ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව විසින් මුද්‍රණය කළ යුතු යැයි නියෝග කරන ලදී.*

පාර්ලිමේන්තුවේ සභාගත කරන ලද රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ වාර්තා සම්බන්ධයෙන් නිරීක්ෂණ සහ ගන්නා ලද පියවර ඉදිරිපත් කිරීම.

පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 119 (4) හි පහත පරිදි දක්වා ඇත:-

***"පාර්ලිමේන්තුවේ සභාගත කරන ලද රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ යම් වාර්තාවක් මුදල් විෂය භාර අමාත්‍යවරයාට සහ ආයතන භාර අමාත්‍යවරයන්ට යොමු කරනු ලැබිය යුතු අතර, එවිට, මුදල් විෂය භාර ආමාත්‍යවරයා සහ ආයතන භාර අමාත්‍යවරයන් විසින් ඒ සම්බන්ධයෙන් සිය නිරීක්ෂණ සහ ගන්නා ලද පියවර සති අටක් ඇතුළත දී, පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලැබිය යුතු අතර, එම නිරීක්ෂණ සම්බන්ධයෙන් ගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳ ප්‍රකාශයක් ඉදිරිපත් කිරීම හෝ එම නිර්දේශ සම්පූර්ණ කළ නොහැකි බව අමාත්‍යවරයාගේ අදහස නම්, රාජ්‍ය මුදල් නිසි ලෙස භාවිතා කිරීම පිළිබඳ ගතයුතු විකල්ප ක්‍රියාමාර්ග පිළිබඳ ලිඛිතව හේතු පැහැදිලි කළ යුතු අතර, කාරක සභාවට අවශ්‍ය වන්නේ නම් අදාළ අමාත්‍යවරයාට කරුණු පැහැදිලි කිරීම සඳහා කාරක සභාවට පෞද්ගලිකව පැමිණීමට අරාධනාවක් කළ හැකි අතර එවැනි කාරණා වලින් පැන නඟින ප්‍රශ්න වලට සති අටක් ඇතුළත පිළිතුරු සැපයිය යුත්තේ ය. පාර්ලිමේන්තුව විසින් තීරණය කරනු ලබන අවස්ථාවක දී, එකී වාර්තාව නීතිපතිවරයාගේ නිරීක්ෂණ සහ අවශ්‍ය කටයුතු සඳහා යොමු කරනු ලැබිය හැකි ය."***

## <u>දසවැනි පාර්ලිමේන්තුවේ පළමුවැනි සභාවාරය</u>
## <u>රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ සංයුතිය</u>

1. ගරු කබීර් හෂීම් මහතා, පා.ම. (කාරක සභාවේ සභාපති)
2. ගරු ඇන්ටන් ජයකොඩි මහතා, පා.ම.
3. ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) අරුණ ජයසේකර මහතා, පා.ම.
4. ගරු සුගත් තිලකරත්න මහතා, පා.ම.
5. ගරු සුන්දරලිංගම් ප්‍රදීප් මහතා, පා.ම.
6. ගරු නලින් හේවගේ මහතා, පා.ම.
7. ගරු අරවින්ද සෙනරත් මහතා, පා.ම.
8. ගරු දිනිඳු සමන් හෙන්නායක මහතා, පා.ම.,
9. ගරු (ආචාර්ය) එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලාහ් මහතා, පා.ම.
10. ගරු රෝහිත අබේගුණවර්ධන මහතා, පා.ම.
11. ගරු ජේ.සී. අලවතුවල මහතා, පා.ම.
12. ගරු චාමර සම්පත් දසනායක මහතා, පා.ම.
13. ගරු හෙක්ටර් අප්පුහාමි මහතා, පා.ම.
14. ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා, පා.ම.
15. ගරු කවීන්දිරන් කෝඩීස්වරන් මහතා, පා.ම.
16. ගරු නීතිඥ සාගරිකා අතාවුද මහත්මිය, පා.ම.
17. ගරු මංජුල සුරවීර ආරච්චි මහතා, පා.ම.
18. ගරු කේ. ඉලංකුමාරන් මහතා, පා.ම.
19. ගරු ඔෂානි උමංගා මහත්මිය, පා.ම.
20. ගරු අජන්ත ගම්මැදගේ මහතා, පා.ම.
21. ගරු රුවන්තිලක ජයකොඩි මහතා, පා.ම.
22. ගරු නීතිඥ තුෂාරි ජයසිංහ මහත්මිය, පා.ම.
23. ගරු ටී.කේ. ජයසුන්දර මහතා, පා.ම.
24. ගරු එම්.ඒ.එම්. තාහීර් මහතා, පා.ම.
25. ගරු සුසන්ත කුමාර නවරත්න මහතා, පා.ම.
26. ගරු ලාල් ප්‍රේමනාත් මහතා, පා.ම.
27. ගරු චානක මාදුගොඩ මහතා, පා.ම.
28. ගරු සුනිල් රත්නසිරි මහතා, පා.ම.
29. ගරු චන්දන සූරියආරච්චි මහතා, පා.ම.
30. ගරු (වෛද්‍ය) ජනක සේනාරත්න මහතා, පා.ම.

## කාරක සභා ලේකම් කාර්යාලයේ වත්මන් කාර්ය මණ්ඩලය

- සනත් විජේගුණවර්ධන මයා - කාරක සභා ලේකම්/ සහකාර අධ්‍යක්ෂ (පරිපාලන)
- චමීලා රූපසිංහ මහත්මිය - ප්‍රධාන නිලධාරි
- ආර්. ඒ. ඩී. එන්. ගියෝවනී මහත්මිය - නියෝජ්‍ය ප්‍රධාන නිලධාරි
- ජේ. ටී. එල්. පී. සමීර මයා - සහකාර ප්‍රධාන නිලධාරි
- ජී. ඩී. ජේ. එච්. අයේෂ්මන්ති මෙය - පාර්ලිමේන්තු නිලධාරි
- ජී. එම්. කල්ලැගොඩ මහත්මිය - පාර්ලිමේන්තු නිලධාරි
- එම්.එල්.ඒ.ඩී.එම්. කුමාරි මෙය - පාර්ලිමේන්තු නිලධාරි

## කාරක සභා වාර්තා

www.parliament.lk යන වෙබ් අඩවියෙන් පහත සඳහන් ගමන් මාර්ගය ඔස්සේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ වාර්තා බාගත කර ගැනීමට හැක.

Select language → Business of Parliament → Committees

Select Legislature (10th Parliament) ← Committee Reports

Select Session (1st Session) → Select Committee Type

Select Committee ← (Comittees for Special Purposes)

(Committee on Public Accounts) → Search

# පටුන

පිටු අංකය

A. සභාපතිවරයාගේ සටහන ......................................................................6

B. සංක්ෂිප්ත වාර්තාව .........................................................................8

C. විමර්ශනයේදී හඳුනාගත් ප්‍රධාන ගැටළු ආශ්‍රයෙන්,

a. සාකච්ඡා කරන ලද කරුණු

b. ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) / ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්

c. කාරක සභාවේ නිරීක්ෂණ

d. කාරක සභාවේ නිර්දේශ

e. නිර්දේශ ඉටුකිරීමේ ප්‍රගතිය කාරක සභාව වෙත වාර්තා කිරීම පිළිබඳ තොරතුරු ........................................................................ 9

# සභාපතිවරයාගේ සටහන

දසවැනි පාර්ලිමේන්තුවේ පළමුවැනි සභාවාරයේදී රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් 2025.05.09, 2025.06.05 සහ 2025.11.27 යන දිනවලදී ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව සම්බන්ධයෙන් සිදු කරන ලද විමර්ශන ඇතුළත් කාරක සභාවේ අටවැනි වාර්තාව පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 119 (3) හි විධිවිධාන ප්‍රකාරව මම අද දින පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරමි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148 වැනි ව්‍යවස්ථාවෙන්, ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව වෙත පවරා ඇති රාජ්‍ය මූල්‍ය පාලන බලතල හා පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග මගින් සලසා ඇති බලතල අනුව, මූල්‍ය අධීක්ෂණ කාරක සභාවක් වශයෙන් කටයුතු කරනු ලබන රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවට මහජන වියදම් සඳහා පාර්ලිමේන්තුව විසින් ප්‍රදානය කරනු ලබන මුදල් විසර්ජන කිරීම පෙන්නුම් කරන ගිණුම් ද, රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් සුදුසු යැයි සලකනු ලැබිය හැකි පාර්ලිමේන්තුව ඉදිරියේ තබනු ලබන වෙනත් යම් ගිණුම් ද විගණකාධිපතිවරයාගේ සහාය ඇතිව පරීක්ෂා කිරීම, මෙම කාරක සභාවේ මූලික කර්තව්‍ය වේ.

එම කර්තව්‍ය ඉටු කිරීමේදී විගණනය නමැති පශ්චාත් ක්‍රියාවලියෙන් කාරක සභාවට ලැබෙන දායකත්වය ඉමහත් වේ. නිවැරදි විගණනයක් තුළින් හඳුනාගත් දුර්වලතාවලට විසඳුම් ලබා දෙන අතරම, අකාර්යක්ෂමතාවයන් සක්‍රීයව වැළැක්වීම සඳහා අනාගතයේදී අතීත අඩුපාඩු වළක්වා ගැනීමට ආයතනවලට මඟ පෙන්වීමක් ද එතුළින් සිදුවේ.

මෙලෙස තෝරා ගත් මෙම ආයතනය සම්බන්ධයෙන් පමණක් වාර්තාවක් කඩිනමින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට හේතු වූයේ, ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තෙමේන්තුව සම්බන්ධයෙන් හඳුනාගත් අක්‍රමිකතා රාශියක් මෙම විමර්ශනයන්හී දී කාරක සභාවට නිරීක්ෂණය වීමත් යන කරුණු වේ.

රට තුළ යහපත් ආර්ථිකයක් උදාකිරීම සඳහා රාජ්‍ය ආයතනවල පවතින මූල්‍ය අක්‍රමිකතා හා දූෂණ වැළැක්වීමට නිසි පියවර ගැනීම සියලු රාජ්‍ය නිලධාරීන්ගේ වගකීමක් වන අතර, කාරක සභාවේ නිර්දේශ ක්‍රියාත්මක කිරීමට කඩිනම් අවධානය යොමු කිරීම, සුදුසු විනය ක්‍රියාමාර්ගයන් ක්‍රියාත්මක කිරීම හා සියලු ක්‍රියාවන් සම්බන්ධයෙන් පසු විපරම් සිදු කරමින් අදාළ නිර්දේශ/ එකඟතා ක්‍රියාත්මකභාවයට පත් කිරීම කාරක සභාව හමුවට කැඳවනු ලබන ආයතනවල ප්‍රධාන ගණන් දීමේ නිලධාරීන්ගේ වගකීම වේ.

රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ සාර්ථකත්වය රැඳී තිබෙන්නේ ඊට දායක වන සියලුම පාර්ශ්වකරුවන්ගේ ක්‍රියාකාරී සහභාගීත්වය මත ය. එබැවින්, රාජ්‍ය මූල්‍ය යාන්ත්‍රණය ශක්තිමත් කිරීමට රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවෙන් මෙතෙක් ගත් ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් පසුගිය ගිණුම් කාරක සභාවල සේවය කළ සභාපතිවරුන් ඇතුළු සභික මන්ත්‍රීවරුන්ටත්, කාරක සභා කටයුතු සාර්ථකව පවත්වාගෙන යාමට පක්ෂ විපක්ෂ භේදයකින් තොරව මා හට පූර්ණ

සහයෝගය ලබා දෙන වර්තමාන සභික මන්ත්‍රීවරුන්ටත් මාගේ කෘතඥතාවය පුද කරමි.

තවද, විවිධ අභියෝග මධ්‍යයේ වුවද කාරක සභාවේ කටයුතු කාර්යක්ෂමව ඉටුකිරීමට ලබාදෙන සහයෝගය වෙනුවෙන් විගණකාධිපතිවරයා ඇතුළු කාර්ය මණ්ඩලයට ද, මහා භාණ්ඩාගාරයේ නිලධාරීන්ට ද, පාර්ලිමේන්තුවේ මහ ලේකම් ඇතුලු රජයේ ගිණුම් පිළිබඳ කාරක සභා කාර්යාංශයේ සියලුම නිලධාරීන්ට ද කාරක සභාව සිය ස්තුතිය හා ප්‍රසාදය පිරිනමනු ලබන බව මෙහි ලා සඳහන් කරනු කැමැත්තෙමි.

**කබීර් හෂීම්**
සභාපති
රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව

## <u>සංක්ෂිප්ත වාර්තාව</u>

දසවැනි පාර්ලිමේන්තුවේ පළමුවැනි සභා වාරයේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් **2025.05.09, 2025.06.05** සහ **2025.11.27** යන දිනයන්හිදී ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තෙම්න්තුවේ 2023 මූල්‍ය වර්ෂය සඳහා විගණකාධිපති වාර්තාව සලකා බැලීම සහ වර්තමාන කාර්යසාධනය පිළිබඳ විමර්ශනය කරන ලද අතර, එම කාරක සභා රැස්වීම්වලදී සාකච්ඡා කරන ලද කරුණු, ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා (ප්‍ර.ග.නි.) / ගණන්දීමේ නිලධාරියා (ග.නි.) විසින් කරන ලද පැහැදිලි කිරීම් සහ කාරක සභාවේදී ලබාදෙන ලද නිර්දේශ මෙම වාර්තාවේ අඩංගු වේ.

කැඳවන ලද ආයතන -

- ❖ ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව

විමර්ශන සහාය: ජාතික විගණන කාර්යාලය

මෙම විමර්ශනයන් සඳහා ඉහත සඳහන් විගණන වාර්තාව මගින් අනාවරණය කරන ලද විගණන නිරීක්ෂණ පාදක කොට ගෙන ඇති අතර, කාරක සභා රැස්වීම්වලදී සාකච්ඡාවට ලක් කරන ලද කරුණු වලට අදාල වැඩිමනත් තොරතුරු එම විගණන වාර්තාවෙහි අන්තර්ගත වේ. එම විගණන වාර්තාව පහත සබැඳි ඔස්සේ බාගත කරගත හැකිය.

**<u>2023 වර්ෂය:-</u>**

**https://auditorgeneral.gov.lk/web/images/audit-reports/upload/2023/min_dep/1-xxi/Head306Department-of-SriLanka-RailwaysS.pdf**

**විමර්ශනයේදී හඳුනාගත් ප්‍රධාන ගැටළු ආශ්‍රයෙන්,**

***a.*** **සාකච්ඡා කරන ලද කරුණු**
***b.*** **ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) / ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්**
***c.*** **කාරක සභාවේ නිරීක්ෂණ**
***d.*** **කාරක සභාවේ තීරණ සහ නිර්දේශ**
***e.*** **නිර්දේශ ඉටුකිරීමේ ප්‍රගතිය කාරක සභාව වෙත වාර්තා කිරීම**

**පිළිබඳ තොරතුරු**

❖ ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ගණන් දීමේ නිලධාරී (ප්‍ර.ග.නි.) :-
ලේකම්, ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යාංශය

❖ ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ ගණන් දීමේ නිලධාරී (ග.නි.) :-
සාමාන්‍යාධිකාරී, ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව

01) **විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්වීම.**

❖ විමර්ශනය කරන ලද දිනය - 2025.05.09

**a. සාකච්ඡා කරන ලද කරුණු (විගණකාධිපති නිරීක්ෂණ අනුව)**

කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ අංක ඩී.එම්.ඒ/01/2019 හා 2019 ජනවාරි 12 දිනැති කළමණාකරන විගණන අභ්‍යන්තර විගණන මාර්ගෝපදේශයේ 5.3 ඡේදයට අනුව වර්ෂයකට අවම වශයෙන් විගණන හා කළමණාකරන කමිටු රැස්වීම් 04 ක් වත් පැවැත්විය යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබූ බවත්, එය පහත වගුවේ පරිදි වන බව විගණනය විසින් පෙන්වා දෙන ලදී.

*වගුව 1: එක් එක් වර්ෂයට අදාළව පැවැත්වූ විගණන හා කළමනාකරණ කමිටු ගණන*

| වර්ෂය | පැවැත්වූ වාර ගණන |
|---|---|
| 2021 | 01 |
| 2022 | 02 |
| 2023 | 02 |
| 2024 | 02 |
| 2025 | 01 |

විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් හරහා විගණනයේදී පෙන්වා දෙන ගැටළු ඇතුළු සියලු කරුණු සාකච්ඡා කොට දෙපාර්තමේන්තු ක්‍රමවේද නිවැරදි කර ගැනීමේ අවස්ථාව එම කමිටු නිසි පරිදි නොපැවැත්වීම හේතුවෙන් දුම්රිය දෙපාර්තමේන්තුවට මගහැරී ඇති බව විගණනය විසින් පෙන්වා දෙන ලදී.

**b. ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්**

2025 වර්ෂයේදී විගණන හා කළමනාකරණ කමිටු නිසි පරිදි පවත්වා එතුළින් දෙපාර්තමේන්තු ක්‍රමවේද නිවැරදි කර ගැනීමට අපේක්ෂා කරන බව ග.නි. ප්‍රකාශ කළේය.

**c. කාරක සභාවේ නිරීක්ෂණ**

කෙටි කාලසීමාවක් තුල දුම්රිය සාමාන්‍යාධිකාරීවරුන් කිහිප දෙනෙකු පත් වීම, රටේ පැවති වසංගත වැනි තත්ත්වයන් හේතුවෙන් රජයෙන් ගත් තීරණ, දුම්රිය දෙපාර්තමේන්තු සේවකයන් විසින් පවත්වනු ලැබූ වෘත්තීය ක්‍රියාමාර්ග වැනි කරුණු හේතුවෙන් විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්වීමට අපොහොසත් වී ඇති බවත්,

මෙම ගැටලුවට නිශ්චිත පිළිතුරක් එවකට දුම්රිය දෙපාර්තමේන්තු පාලන අධිකාරිය ලබා දීමට අපොහොසත් වූ බවත් කාරක සභාව විසින් නිරීක්ෂණය කරන ලදී.

**d. කාරක සභාවේ නිර්දේශ**

1. විගණන හා කළමණාකරන කමිටු රැස්වීම් නියමිත පරිදි පවත්වා එතුළින් දෙපාර්තමේන්තු ක්‍රමවේද නිවැරදි කර ගැනීමෙන් අභ්‍යන්තර පාලනය ශක්තිමත් කර ගැනීමට කටයුතු කරන ලෙස කාරක සභාව ප්‍ර.ග.නි./ ග.නි. වෙත,

2. මෙම කාල සීමාවේ සේවයේ නියුතුව සිටි හිටපු දුම්රිය සාමාන්‍යාධිකාරීවරුන් සහ අමාත්‍යාංශ ලේකම්වරුන් මීළඟ රැස්වීමට කැඳවා ප්‍රමාදයන්ට හේතු විමසීමට කාරක සභාව තීරණය කළ අතර අවශ්‍ය තොරතුරු ලබා ගෙන එකී නිලධාරීන් කාරක සභාව හමුවට කැඳවන ලෙස කාරක සභාවේ ලේකම් වෙත,

නිර්දේශ කළ අතර, ප්‍ර.ග.නි./ ග.නි. ඒ සඳහා එකඟ වන ලදී.

## e. නිර්දේශ ඉටු කිරීමේ ප්‍රගතිය කාරක සභාව වෙත වාර්තා කිරීම

- කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ අංක DMA/01/2019 හා 2019.01.12 දිනැති කළමනාකරණ විගණන අභ්‍යන්තර විගණන මාර්ගෝපදේශ අනුව විගණන කළමනාකරණ කමිටුව දුම්රිය සාමාන්‍යාධිකාරී (සභාපති), දෙපාර්තමේන්තු ප්‍රධාන අභ්‍යන්තර විගණක (කැඳවුම්කරු), දෙපාර්තමේන්තු ප්‍රධාන මූල්‍ය නිලධාරී (සමාජික), භාණ්ඩාගාර විගණන හා කළමනාකරණ දෙපාර්තමේන්තු නියෝජිතයකු (සාමාජික), විගණකාධිපතිගේ නියෝජිතයකු ලෙස සහකාර විගණකාධිපති හෝ විගණක අධිකාරී (නිරීක්ෂක), ප්‍රවාහන අමාත්‍යාංශ අභ්‍යන්තර විගණක (නිරීක්ෂක) යන නිලධාරීන්ගෙන් සමන්විත විය යුතු බවත්,

- සාකච්ඡා කරනු ලබන කරුණු සම්බන්ධයෙන් තීරණ ගැනීම සඳහා දුම්රිය සාමාන්‍යාධිකාරී (සභාපති) විගණකාධිපතිගේ නියෝජිත (නිරීක්ෂක) හා භාණ්ඩාගාරයේ නියෝජිත (සාමාජික) යන නිලධාරීන් සහභාගී වීම අත්‍යාවශ්‍ය බවත්, ගැටලුකාරී තත්ත්වය සාකච්ඡා කර තීරණ ගැනීමට අනෙකුත් නිලධාරීන්ට නොහැකි බවත්,

- විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම සඳහා කමිටු සභාපතිවරයාටත් විගණකාධිපතිගේ නියෝජිත හා භාණ්ඩාගාර නියෝජිතවරයාට සහභාගි විය හැකි දිනයක් යොදා ගැනීමට දුරකථන මඟින් සාකච්ඡා කර තීරණය කරනු ලබන බවත්, එම දිනය බොහෝ විට දින 14කට පමණ පෙර තීරණය කරන අතර පසුව ඇතිවන යම් විශේෂිත කරුණු මත එම නිලධාරීන්ට එසේ සහභාගී වීමට නොහැකි නම් රැස්වීම පසුවට කල් දැමීමට සිදුවන බවත්, නැවත දිනයක් යොදා ගැනීම ඉතා අපහසු බැවින් ඇතැම් විට රැස්වීම් නොපැවැත්වීමට සිදුවන බවත්,

- 2021 වර්ෂයේ දී ද මෙම අහිතකර තත්ත්වය මත කොවිඩ් - 19 තුන්වන රැල්ල ව්‍යාප්ත වීම නිසා 2021 සැප්තැම්බර් 30 දක්වා විගණන කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්වීමෙන් නිදහස් කරන බවට විගණන කළමනාකරණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක DMA/AMC/M/2021/2 හා 2021.09.06 දිනැති චක්‍රලේඛයේ උපදෙස් දී ඇති බවත්, 2021 අවසන් කාර්තුවේ දී රැස්වීමක් පවත්වන ලෙස උපදෙස් ලැබුණු බවත්. ඒ අනුව 2021.12.14 දින එක් රැස්වීමක් පවත්වා ඇති බවත්,

- 2023 වර්ෂයේ 2023.05.12 හා 2023.11.16 දින රැස්වීම් දෙකක් පැවැත්වූ බවත්, ඉතිරි රැස්වීම් පැවැත්වීමට නොහැකි වී ඇති බවත්,

- 2024 වර්ෂයේ 2024.07.10 හා 2024.10.16 දින රැස්වීම් දෙකක් පැවැත්වූ බවත්, 2024.12.26 දිනට නියමිතව තිබූ රැස්වීම නව දුම්රිය සාමාන්‍යාධිකාරී රාජකාරී භාරගත් දිනට යෙදී තිබුණ බැවින් එදින පැවැත්වීමට නොහැකිවුණු බව දන්වමින් MT/04/14/03/01-2025 හා 2025.06.04 දිනැති ලිපියට අදාළ වාර්තාව දුම්රිය දෙපාර්තමේන්තුව ඉදිරිපත් කර ඇත.

- කළමනාකරණ විගණන මාර්ගෝපදේශයේ 2.2 (i) වගන්තිය අනුව සෑම කාර්තුවකටම එක් රැස්වීමක් වන පරිදි රැස්වීම් 04 ක් වත් පැවැත්විය යුතු අතර 2025 වර්ෂය වෙනුවෙන් කමිටු රැස්වීම් 03 ක් පවත්වා තිබුණු බව විගණකාධිපති පෙන්වා දෙන ලදී.

❖ <u>විමර්ශනය කරන ලද දිනය - 2025.06.05</u>

**a. සාකච්ඡා කරන ලද කරුණු (විගණකාධිපති නිරීක්ෂණ අනුව)**

වර්ෂයකට අවම වශයෙන් විගණන හා කළමණාකරන කමිටු රැස්වීම් 04 ක් වත් පැවත්විය යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබීම පිළිබඳව මින් පෙර සේවය කරන ලද දුම්රිය සාමාන්‍යාධිකාරීවරුන්ගෙන් සහ හිටපු අමාත්‍යාංශ ලේකම්වරුන්ගෙන් විමසිය යුතු බවට කාරක සභාව විසින් කළ නිර්දේශයට ප්‍ර.ග.නි/ග.නි එකඟ වූ බව විගණනය විසින් දන්වන ලදී.

**b. ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) / ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්**

2019 වසරේදී විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් 4ම පවත්වා ඇති බවත්, 2020 සහ 2021 වසර වල පැවති කොවිඩ් වසංගත තත්ත්වය හේතුවෙන් නිසි පරිදි විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්වීමට දෙපාර්තමේන්තුව අපොහොසත් වූ බවත්, කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ 2020.06.02 දිනැති කළමනාකරණ චක්‍රලේඛ අංක DMA/AMC/M/2020/5-4 ට අනුකූල වෙමින් අදාළ රැස්වීම් පැවැත්වීම සීමා කළ බවත්, දුම්රිය දෙපාර්තමේන්තුවේ නිලධාරීහු ප්‍රකාශ කළහ.

**c. කාරක සභාවේ නිරීක්ෂණ**

විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් නොපැවැත්වීම හේතුවෙන් විගණන විමසුම් මගින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කර ගැනීමෙන්

වඩාත් ඵලදායි සේවා තත්ත්වයක් ඇති කර ගැනීමට නොහැකි වීම දුම්රිය දෙපාර්තමේන්තුවේ අකාර්යක්ෂමතාවයට සෘජු ලෙස බලපා ඇති බව කාරක සභාවේ නිරීක්ෂණය විය.

**d. කාරක සභාවේ නිර්දේශ**

මෙම විගණන කරුණ සම්බන්ධයෙන් කාරක සභාව විසින් මෙදින කිසිදු නිර්දේශයක් ලබා නොදෙන ලදී.

**e. නිර්දේශ ඉටු කිරීමේ ප්‍රගතිය කාරක සභාව වෙත වාර්තා කිරීම**

අදාල නොවේ.

## 02) වාර්ෂික වාර්තා ප්‍රමාදව පාර්ලිමේන්තුවේ සභාගත කිරීම

❖ විමර්ශනය කරන ලද දිනය - 2025.05.09

**a. සාකච්ඡා කරන ලද කරුණු (විගණකාධිපති නිරීක්ෂණ අනුව)**

අංක 02/2020 හා 2020 අගෝස්තු 28 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 12.1 ඡේදයට අනුව දෙපාර්තමේන්තුව විසින් ගිණුම් වර්ෂය අවසාන වී දින 150 ක් ඇතුලත වාර්ෂික කාර්යසාධන වාර්තා සකස් කර පාර්ලිමේන්තුවට සභාගත කිරීම සඳහා ඉදිරිපත් කළ යුතු වුවත්, 2020, 2021, 2022 හා 2023 වර්ෂයන්ට අදාල වාර්ෂික වාර්තා පහත පරිදි ප්‍රමාදයන් සහිතව සභාගත කිරීම සඳහා ඉදිරිපත් කර තිබුණු බවත්,

වගුව 2: එක් එක් වර්ෂයන්ට අදාල වාර්ෂික වාර්තා සභාගතකළ දින

| වර්ෂය | සභාගත කිරීම සඳහා ඉදිරිපත් කළ දිනය |
|---|---|
| 2020 | 2023/05/31 |
| 2021 | 2023/05/31 |
| 2022 | 2023/12/12 |
| 2023 | 2025/01/22 |
| 2024 | 2025/08/19 |

### b. ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) / ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්

මෙම කරුණ සම්බන්ධයෙන් සැලකියයුතු පැහැදිළිකිරීමක් ප්‍ර.ග.නි./ග.නි. වෙතින් කාරක සභාවට නොලැබිණි.

### c. කාරක සභාවේ නිරීක්ෂණ

දුම්රිය දෙපාර්තමේන්තුව පාර්ලිමේන්තුවට වාර්තා ඉදිරිපත් කිරීමේදී ඉතාම අකාර්යක්ෂමව කටයුතු කර ඇති බව කාරක සභාවේ නිරීක්ෂණය විය.

### d. කාරක සභාවේ නිර්දේශ

1. ඉදිරියේදී ප්‍රමාදයකින් තොරව වාර්ෂික වාර්තා ඉදිරිපත් කිරීමට කටයුතු කරන ලෙස කාරක සභාව දෙපාර්තමේන්තුවේ ග.නි. වෙත නිර්දේශ කළේය.

2. මෙම කාල සීමාවේ සේවයේ නියුතුව සිටි හිටපු දුම්රිය සාමාන්‍යාධිකාරීවරුන් සහ අමාත්‍යාංශ ලේකම්වරුන් මීළඟ රැස්වීමට කැඳවා ප්‍රමාදයන්ට හේතු විමසීමට කාරක සභාව තීරණය කළ අතර අවශ්‍ය තොරතුරු ලබා ගෙන එකී නිලධාරීන් කාරක සභාව හමුවට කැඳවන ලෙස කාරක සභාවේ ලේකම් වෙත කාරක සභාව නිර්දේශ කළේය.

### e. නිර්දේශ ඉටු කිරීමේ ප්‍රගතිය කාරක සභාව වෙත වාර්තා කිරීම

- 2020 වර්ෂයේ හා 2021වර්ෂයේ පැවති කොරෝනා තත්ත්වයන් හේතුවෙන් සංචරණ සීමා පැනවූ බවත්, ඒ හේතුවෙන් කාර්යාලවලට පැමිනෙණ සේවක මණ්ඩලය බෙහෙවින් සීමා වූ බවත් එම හේතුවෙන් කාර්යසාධන වාර්තාව සඳහා තොරතුරු ලබාගැනීමේ ප්‍රමාදයන් සිදුවීම හේතුවෙන් 2020 හා 2021 වර්ෂයන්ට අදාලව කාර්යසාධන වාර්තා පිළියෙළ කිරීමට හැකි වුයේ 2022 වර්ෂයේ වූ බවත්,

- පවතින කාර්ය මණ්ඩල හිඟය මත උප දෙපාර්තමේන්තු 09කින් තොරතුරු ලබා ගැනීමේදී සිදුවන ප්‍රමාදය මත 2023 වර්ෂයේ කාර්යසාධන වාර්තාව ප්‍රමාද වී පාර්ලිමේන්තුවේ සභාගත කර ඇති බවත්,

- 2024 වර්ෂයේ කාර්යසාධන වාර්තාවේ කෙටුම්පත ප්‍රවාහන, මහාමාර්ග, වරාය හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය සඳහා 2025/06/02 දින ඉදිරිපත් කර ඇත. 2025/05/30 දින නිකුත් කර ඇති රාජ්‍ය මුදල් චක්‍රලේඛ 2/2025ට අනුව 2025/06/30 දිනට පෙර 2024 වර්ෂයේ කාර්යසාධන වාර්තාව සභාගත කිරීමට කටයුතු කරන බවත්,

දන්වමින් MT/04/14/03/01-2025 හා 2025.06.04 දිනැති ලිපියට අදාළ වාර්තාව දුම්රිය දෙපාර්තමේන්තුව ඉදිරිපත් කර ඇත.

## 03) <u>විගණන විමසුම් වලට පිළිතුරු ලබා නොදීම</u>

❖ <u>විමර්ශනය කරන ලද දිනය - 2025.05.09</u>

**a. සාකච්ඡා කරන ලද කරුණු (විගණකාධිපති නිරීක්ෂණ අනුව)**

2022 සිට 2024 දක්වා නිකුත් කරන ලද විගණන විමසුම් වලින් පිළිතුරු ලබා නොදුන් විගණන විමසුම් 27 ක් පවතින බව විගණනය විසින් පෙන්වාදෙන ලදී.

**b. ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) / ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්**

දුම්රිය දෙපාර්තමේන්තුවේ උප දෙපාර්තමේන්තු 9 ක් පැවතීම හා සේවක හිඟය හේතුවෙන් විගණන විමසුම් සඳහා පිළිතුරු සැපයීමේ ප්‍රමාදයන් ඇති වී ඇති බව ප්‍රධාන මූල්‍ය නිලධාරි ප්‍රකාශ කළාය. එමෙන්ම 2024 වසරේ දුම්රිය දෙපාර්තමේන්තුව වෙත නිකුත් කරන ලද විගණන විමසුම් 51 ක් අතුරින් 36 ක් සඳහා මේ වන විට පිළිතුරු සපයා ඇති බව නිලධාරීහු තව දුරටත් ප්‍රකාශ කළහ.

**c. කාරක සභාවේ නිරීක්ෂණ**

විගණන විමසුම් අවම කර ගැනීම, විගණන හා කළමණාකරන කමිටු රැස්වීම් තුළින් දෙපාර්තමේන්තු ක්‍රමවේද නිවැරදි කරගත හැකි බවත් මෙම කාල සීමාවේ සේවයේ නියුතුව සිටි හිටපු දුම්රිය සාමාන්‍යාධිකාරීවරුන්, අමාත්‍යාංශ ලේකම්වරුන් ඇතුලු වගකිව යුතු නිලධාරීන් මීළඟ රැස්වීමට කැඳවා ප්‍රමාදයන්ට හේතු විමසීම සුදුසු යැයි කාරක සභාව විසින් නිරීක්ෂණය කරන ලදී.

**d. කාරක සභාවේ නිර්දේශ**

1. විගණන විමසුම් අවම කර ගැනීම සඳහා විගණන හා කළමණාකරන කමිටු රැස්වීම් තුළින් දෙපාර්තමේන්තු ක්‍රමවේද නිවැරදි කර ගැනීමට කටයුතු කරන ලෙස දුම්රිය සාමාන්‍යාධිකාරී (ග/නි) වෙත කාරක සභාව නිර්දේශ කළේය.

2. මෙම කාල සීමාවේ සේවයේ නියුතුව සිටි හිටපු දුම්රිය සාමාන්‍යාධිකාරීවරුන්, අමාත්‍යාංශ ලේකම්වරුන් ඇතුලු වගකිව යුතු

නිලධාරීන් මීළඟ රැස්වීමට කැඳවා ප්‍රමාදයන්ට හේතු විමසීමට කාරක සභාව තීරණය කළ අතර අවශ්‍ය තොරතුරු ලබා ගෙන එකී නිලධාරීන් කාරක සභාව හමුවට කැඳවන ලෙස කාරක සභාවේ ලේකම් වෙත කාරක සභාව නිර්දේශ කළේය.

**e. නිර්දේශ ඉටු කිරීමේ ප්‍රගතිය කාරක සභාව වෙත වාර්තා කිරීම**

- 2025 ජූනි මස 05 වැනි දින පැවති කාරක සභාවට 2022 සිට 2024 කාල සීමාවේ සේවයේ නියුතුව සිටි හිටපු දුම්රිය සාමාන්‍යාධිකාරීවරුන්, අමාත්‍යාංශ ලේකම්වරුන් ඇතුලු වගකිව යුතු නිලධාරීන් කැඳවා ප්‍රමාදයන්ට හේතු විමසනු ලැබූ අතර එවකට ලොව පුරා පැතිර ගිය COVID - 19 වසංගත තත්ත්වය හේතුවෙන් රජය මගින් ගනු ලැබූ තීරණ, දුම්රිය සේවකයන්ගේ උද්ඝෝෂණ වැනි කරුණු හේතුවෙන් විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් කල්දැමීමට/අවලංගු කිරීමට සිදු වූ බව කාරක සභාව ඉදිරියේ අනාවරණය කරන ලදී.

- 2022 වර්ෂයට අදාලව විගණන විමසුම් 67ක් පැවති බවත්, ඒ සියලුම විගණන විමසුම්වලට පිළිතුරු ලබා දී ඇති බවත්,

- 2023 වර්ෂයට අදාලව විගණන විමසුම් 53ක් පැවති බවත්, ඒ සියලුම විගණන විමසුම්වලට පිළිතුරු ලබා දී ඇති බවත්,

- 2024 වර්ෂයට අදාලව විගණන විමසුම් 51ක් පැවති බවත්, ඉන් විගණන විමසුම් 41කට පිළිතුරු ලබා දී ඇති බවත්, විගණන විමසුම් 10කට පිළිතුරු ලබා දීමට ඇති බවත්,

- 2025 වර්ෂයට අදාලව විගණන විමසුම් 25ක් පැවති බවත්, ඉන් විගණන විමසුම් 7කට පිළිතුරු ලබා දී ඇති බවත්, විගණන විමසුම් 18කට පිළිතුරු ලබා දීමට ඇති බවත්,

M/04/14/03/01-2025 හා 2025.06.04 දිනැති ලිපියට අදාළ වාර්තාවේ සඳහන් කර කාරක සභාවට ඉදිරිපත් කර ඇත.

❖ <u>විමර්ශනය කරන ලද දිනය - 2025.06.05</u>

**a. සාකච්ඡා කරන ලද කරුණු (විගණකාධිපති නිරීක්ෂණ අනුව)**

2022 සිට 2024 වර්ෂය දක්වා කාලය තුළ පිළිතුරු නොදුන් විගණන විමසුම් සංඛ්‍යාව 27 ක් වන බව කාරක සභාව විසින් පෙන්වා දෙන ලදී.

**b. ප්‍රධාන ගණකන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) / ගණකන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්**

රටෙහි එවකට වූ තත්ත්වයන් හා රජය විසින් ගත විවිධ තීරණ හේතුවෙන් නිසි පරිදි විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්වීමට නොහැකි වූ බව දුම්රිය දෙපාර්තමේන්තුවේ මතය විය.

**c. කාරක සභාවේ නිරීක්ෂණ**

විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්වීමේ ප්‍රධාන අරමුණ විය යුත්තේ විගණන විමසුම් මගින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කර ගැනීමෙන් වඩාත් ඵලදායි සේවා තත්ත්වයක් ඇති කිරීම බව කාරක සභාවේ මතය විය.

**d. කාරක සභාවේ නිර්දේශ**

මෙම විගණන කරුණ සම්බන්ධයෙන් මෙදින කිසිදු නිර්දේශයක් කාරක සභාව විසින් ලබා නොදෙන ලදී.

**e. නිර්දේශ ඉටු කිරීමේ ප්‍රගතිය කාරක සභාව වෙත වාර්තා කිරීම**

අදාල නොවේ.

04) <u>වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සඳහා අනුමැතිය ලබා නොගැනීම විගණන විමසුම් වලට පිළිතුරු ලබා නොදීම</u>

❖ <u>විමර්ශනය කරන ලද දිනය - 2025.05.09</u>

**a. සාකච්ඡා කරන ලද කරුණු (විගණකාධිපති නිරීක්ෂණ අනුව)**

අංක 02/2020 හා 2020 අගෝස්තු 28 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 04 වන ඡේදයට අනුව ප්‍රසම්පාදන සැලැස්ම සඳහා ප්‍රධාන ගණකන්දීමේ නිලධාරියාගෙන් අනුමැතිය ලබා ගත යුතු වුවත් 2024 වර්ෂයේ ප්‍රසම්පාදන සැලැස්ම සඳහා අදාල අනුමැතිය ලබාගෙන නොමැති බව විගණනය විසින් පෙන්වා දෙන ලදී.

### b. ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) / ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්

දුම්රිය දෙපාර්තමේන්තුව සඳහා වන මිලදී ගැනීම් "වාර්ෂික අවශතා ලැයිස්තුව (Annual Requirement List)" මත පදනම් වී සිදු කර ඇති බවත්, 2025 වර්ෂය සඳහා යෝජිත ප්‍රසම්පාදන සැලැස්ම අනුමැතිය සඳහා ප්‍රවාහන,මහාමාර්ග හා නාගරික සංවර්ධන අමාත්‍යාංශයට ඉදිරිපත් කර ඇති බව ගණන්දීමේ නිලධාරියා ප්‍රකාශ කර සිටියේය.

### c. කාරක සභාවේ නිරීක්ෂණ

2006 වසරේ දී රජය විසින් එළිදක්වනු ලැබූ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය, දුම්රිය දෙපාර්තමේන්තුව විසින් 2024 වසර වන තෙක්ම, ක්‍රියාත්මක නොකිරීම කාරක සභාවේ දැඩි දෝෂ දර්ශනයට ලක් විය.

එමෙන්ම ප්‍රසම්පාදන සැලැස්මේ අධීක්ෂණ කටයුතු ප්‍රසම්පාදන කොමිෂන් සභාවට පැවරී ඇති හෙයින් රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව මඟින් අධීක්ෂණයක් සිදු නොකරන බව නිලධාරීහු ප්‍රකාශ කළහ.

### d. කාරක සභාවේ නිර්දේශ

1. අදාළ කාල සීමාවේ සේවයේ නියුතුව සිටි හිටපු දුම්රිය සාමාන්‍යාධිකාරීවරුන්, අමාත්‍යාංශ ලේකම්වරුන් ඇතුලු වගකිව යුතු නිලධාරීන් මීළඟ රැස්වීමට කැඳවා මෙම කරුණට අදාළව හේතු විමසීමට කාරක සභාව තීරණය කළ අතර අවශ්‍ය තොරතුරු ලබා ගෙන එකී නිලධාරීන් කාරක සභාව හමුවට කැඳවන ලෙස කාරක සභාවේ ලේකම් වෙත නිර්දේශ කළේය.

2. 2025 වර්ෂයට අදාළ ප්‍රසම්පාදන සැලැස්ම සතියක් ඇතුළත (2025.05.16 දින වන විට) මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය වෙත ලැබීමට කටයුතු කරන ලෙස කාරක සභාව ග.නි වෙත නිර්දේශ කළාය.

### e. නිර්දේශ ඉටු කිරීමේ ප්‍රගතිය කාරක සභාව වෙත වාර්තා කිරීම

- 2025 වර්ෂයට අදාළ යෝජිත ප්‍රසම්පාදන සැලැස්ම ප්‍රවාහන, මහාමාර්ග හා නාගරික සංවර්ධන අමාත්‍යාංශයට ඉදිරිපත් කර ඇති බව M/04/14/03/01-2025 හා 2025.06.04 දිනැති ලිපියට අදාළ වාර්තාවේ ඇමුණුම 05 මගින් කාරක සභාවට ඉදිරිපත් කර ඇත.

❖ <u>විමර්ශනය කරන ලද දිනය - 2025.06.05</u>

**a. සාකච්ඡා කරන ලද කරුණු (විගණකාධිපති නිරීක්ෂණ අනුව)**

2024 හා 2025 වසර සඳහා ද ප්‍රසම්පාදන සැලසුම් අනුමත කර නොගැනීම සම්බන්ධයෙන් විගණනය පෙන්වා දෙන ලදී.

**b. ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) / ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම**

2024 ප්‍රසම්පාදන සැලැස්ම ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත ප්‍රමාදව ඉදිරිපත් කරන ලද බවත්, 2025 වසර සඳහා ප්‍රසම්පාදන සැලැස්ම මේ වන විට අමාත්‍යාංශයට යොමු කර ඇති බවත් ගණන්දීමේ නිලධාරී ප්‍රකාශ කළේය.

**c. කාරක සභාවේ නිරීක්ෂණ**

සියළුම රාජ්‍ය ආයතන සෑම වසරකම දෙසැම්බර් 10 වන දින වන විට තම ආයතනයේ ප්‍රසම්පාදන සැලැස්ම ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා වෙතින් අනුමත කර ගත යුතු අතර පිටපත් රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව, ප්‍රසම්පාදන කොමිෂන් සභාව හා විගණකාධිපති වෙත යොමු කල යුතු බවත්, ප්‍රසම්පාදන ක්‍රියාවලියේ දුර්වලතා හේතුවෙන් දෙපාර්තමේන්තුව විසින් මිලදී ගෙන ඇති මිල අධික යන්ත්‍ර හා උපකරණ ඌන උපයෝජිතව පවතින බවත්, කාරක සභාව විසින් නිරීක්ෂණය කරන ලදී.

**d. කාරක සභාවේ නිර්දේශ**

ප්‍රසම්පාදන ක්‍රියාවලියේ දුර්වලතා හේතුවෙන් දෙපාර්තමේන්තුව විසින් මිලදී ගෙන ඇති මිල අධික යන්ත්‍ර /යන්ත්‍රාගාර හා උපකරණ ඌන උපයෝජිතව පැවතීම කෙරෙහි අවධානය යොමු කළ කාරක සභාව 2012 වසරේ සිට එම මිලදී ගැනීම් වලදී නිසි ශක්‍යතා අධ්‍යයනයක් සිදු කර නියමිත ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කර ඇත්ද යන්න පිළිබඳව වාර්තාවක් කාරක සභාව වෙත ලබා දෙන ලෙස දෙපාර්තමේන්තුවේ ගණන්දීමේ නිලධාරියා වෙත නිර්දේශ කෙරිණි.

**e. නිර්දේශ ඉටු කිරීමේ ප්‍රගතිය කාරක සභාව වෙත වාර්තා කිරීම**

2012 වර්ෂයෙන් පසු රත්මලාන ප්‍රධාන යාන්ත්‍රික උප දෙපාර්තමේන්තුවට ප්‍රධාන යන්ත්‍ර 58කට ආසන්න ප්‍රමාණයක් මිලදී ගෙන ඇති බවත්, එයින්, Vertical Hydraulic Wheel 500T, Hydraulic Wheel Press, Universal Dynamic Balancing Machine, Injector Pump Testing Machine හා

Common Rail Injector Tester යන උපකරණ/යන්ත්‍ර 05ක් ඌන උපයෝජිතව පවතින බව MT/04/14/03/01-2025 හා 2025.11.13 දිනැති ලිපිය මගින් ඉදිරිපත් කර ඇති වාර්තාවේ, ඇමුණුම 14,15,16,17 හා 18 යටතේ කාරක සභාව වෙත ඉදිරිපත් කර ඇත.

## 05) ක්‍රියාකාරී සැලැස්ම.

- <u>විමර්ශනය කරන ලද දිනය - 2025.05.09</u>

### a. සාකච්ඡා කරන ලද කරුණු (විගණකාධිපති නිරීක්ෂණ අනුව)

අංක 02/2020 හා 2020 අගෝස්තු 28 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 03 වන ඡේදයට අනුව ඉදිරි වර්ෂය සඳහා වාර්ෂික ක්‍රියාකාරි සැලැස්ම ප්‍රවර්තන වර්ෂයේ දෙසැම්බර් 15 දිනට පෙර සකස් කර ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත ඉදිරිපත් කර අනුමැතිය ලබාගත යුතු වුවද දුම්රිය දෙපාර්තමේන්තුව විසින් 2023 සහ 2024 වර්ෂයන්ට අදාළ වාර්ෂික ක්‍රියාකාරී සැලසුම් ප්‍රමාදයක් සහිතව පිළිවෙලින් 2023 ජනවාරි 16 දින හා 2024 අප්‍රේල් 08 දින අනුමැතිය සඳහා ඉදිරිපත් කර තිබුණු බව විගණනය විසින් පෙන්වා දෙන ලදී.

### b. ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) / ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්

2025 ට අදාල දෙපාර්තමේන්තුවේ ක්‍රියාකාරී සැලැස්ම ඒ වන විට ප්‍රවාහන, මහාමාර්ග හා නාගරික සංවර්ධන අමාත්‍යාංශයට ලැබී ඇති බව ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා ප්‍රකාශ කර සිටියේය.

### c. කාරක සභාවේ නිරීක්ෂණ

අදාළ නොවේ.

### d. කාරක සභාවේ නිර්දේශ

මෙම විගණන කරුණ සඳහා කාරක සභාව විසින් නිර්දේශයක් ලබා නොදෙන ලදී.

### e. නිර්දේශ ඉටු කිරීමේ ප්‍රගතිය කාරක සභාව වෙත වාර්තා කිරීම

අදාළ නොවේ.

## 06) දුම්රිය මාර්ගය අලුතින් ඉදි කිරීම සඳහා ගලවා ඉවත් කළ පැරණි සිල්පර හා රේල්පීලි මහව සිට ඕමන්තෙ දක්වා දුම්රිය මාර්ගය දෙපස ප්‍රයෝජනයට නොගෙන විනාශ වීම.

❖ විමර්ශනය කරන ලද දිනය - 2025.05.09

### a. සාකච්ඡා කරන ලද කරුණු (විගණකාධිපති නිරීක්ෂණ අනුව)

ඉන්දියානු ණය සේවා ගිවිසුම් යටතේ වූ ණය ආධාර අනුව මහව - අනුරාධපුරය - ඕමන්තේ දක්වා දුම්රිය මාර්ගය ඇ.ඩොලර් මිලියන 91.26ක් වැයකර නිම කිරීමට 2019 වර්ෂයේ ආරම්භ කල මහව සිට ඕමන්ත දක්වා දුම්රිය මාර්ගය ඉදි කිරීමේ ව්‍යාපෘතියට අදාලව දුම්රිය මාර්ගය අලුතින් ඉදි කිරීම සඳහා දුම්රිය මාර්ගයේ පැරණි සිල්පර හා රේල්පීලි ගලවා ඉවත් කළ යුතු අතර කොන්ත්‍රාත් ගිවිසුමෙහි අයිතම 7.1 වගන්තිය ප්‍රකාරව එම සිල්පර හා රේල්පීලි ගලවා ළඟම දුම්රිය ස්ථානයට ගෙනගොස් භාර දිය යුතු වුවද, ගිවිසුම් ප්‍රකාරව එම අවශ්‍යතාවය ඉටුවී නොතිබුණු බව නිරීක්ෂණය විය. කොන්ත්‍රාත්කරු විසින් අදියර 01 හා අදියර 02 යටතේ ගලවා ඉවත් කරන ලද සිල්පර කොට 159,626ක් සහ රේල් පීලි 106,464ක් මහව සිට ඕමන්තෙ දක්වා දුම්රිය මාර්ගය දෙපස ස්ථාන 1024 ක ගොඩගසා තිබීමෙන් එම තොග 2025 මාර්තු 31 දින වන විටත් ප්‍රයෝජනයට නොගෙන විනාශ වෙමින් පවතින බව ක්ෂේත්‍ර පරික්ෂාවේදී නිරික්ෂණය වන බව විගණනය විසින් පෙන්වා දෙන ලදී.

### b. ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) / ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්

දැනට කිලෝමීටර 65ක මාර්ගයක් එකවර ගලවා ඉවත් කර ඇති බැවින් එම පැරණි සිල්පර හා රේල්පීලි, ආසන්න දුම්රිය ස්ථානයේ ඉඩම් ප්‍රමාණාත්මක නොමැති වීම හේතුවෙන් ගබඩා කිරීමට පහසුකම් ලබා ගැනීමට හැකියාවක් නොමැති නිසා එසේ ගොඩගසා තැබීමට සිදු වූ බවත්, භාවිතයට ගත හැකි රේල්පීලි හා සිල්පර කොට ඉදිකිරීම් කටයුතු සඳහා දැනටමත් යොදාගෙන ඇති බවත් ඉතිරි කොටස ටෙන්ඩර් කැඳවා විකිණීමට කටයුතු කරන බවත් දුම්රිය දෙපාර්තමේන්තුවේ නිලධාරීහු ප්‍රකාශ කර සිටියහ. එමෙන්ම මගී දුම්රියවලට ප්‍රමුඛතාවය ලබා දීමත්, සේවා දුම්රියවල පවතින හිඟතාවයත් හේතුකොට ගෙන මෙම ප්‍රමාදය සිදු වී ඇති බව ඔවුහු තව දුරටත් ප්‍රකාශ කර සිටියහ.

### c. කාරක සභාවේ නිරීක්ෂණ

සැලැස්මකින් තොරව කටයුතු කිරීමත්, ව්‍යාපෘති යෝජනාව නිවැරදිව සකස් කර නොතිබීමත් මෙම ගැටලුවට ප්‍රධානතම හේතුව වී ඇති බව කාරක සභාවේ නිරීක්ෂණය විය.

### d. කාරක සභාවේ නිර්දේශ

සිල්පර හා රේල්පීලි වර්ගීකරණය කොට අදාල ස්ථානවලින් ඉවත් කිරීම සඳහා සැලැස්මක් සහිත වාර්තාවක් සති 02ක් ඇතුළත ඉදිරිපත් කරන ලෙස දෙපාර්තමේන්තුවේ ග.නි. වෙත කාරක සභාව නිර්දේශ කළාය.

### e. නිර්දේශ ඉටු කිරීමේ ප්‍රගතිය කාරක සභාව වෙත වාර්තා කිරීම

දුම්රිය සාමාන්‍යාධිකාරීගේ හා ප්‍රවාහන, මහාමාර්ග හා නාගරික අමාත්‍යාංශයේ ලේකම්ගේ PS/LEG/COPA/02/DEPT(10)04/2025 වෙළුම II හා 2025/06/04 දිනැති ලිපිය මගින් කාරක සභාව වෙත යොමු කර ඇති පරිදි; භාවිතයට ගත හැකි සිල්පර තෝරා ගැනීමෙන් පසු අධිකාරි ඉංජිනේරු අංශයන් වෙත ප්‍රවාහනය කිරීම සඳහා ටෙන්ඩර් කර ඇති ප්‍රමාණය සම්බන්ධයෙන් තොරතුරු (ඇමුණුම 03) මඟින් ඉදිරිපත් කර ඇත.

❖ <u>විමර්ශනය කරන ලද දිනය - 2025.11.27</u>

### a. සාකච්ඡා කරන ලද කරුණු (විගණකාධිපති නිරීක්ෂණ අනුව)

- 2025 නොවැම්බර් 14 දින වන විටත් සැලැස්මක් කාරක සභාවට යොමු කර නොමැති බවත්,
- සිල්පර හා රේල්පීලි වර්ගීකරණය කිරීමක් කර නොමැති බවත්,
- සිල්පර 24,771 ක් පමණක් ස්ථාන වලට ප්‍රවාහනය කර තිබූ අතර සිල්පර 58,217 ක් තවදුරටත් ප්‍රවාහනය කළ යුතුව ඇති බවත්,
- රේල් පීලි අඩි 62,389 ක් මේ වන විට අදාළ මාර්ග අංශ වෙත ප්‍රවාහනය කර ඇතත්, 203,199 ක ප්‍රමාණයක් ප්‍රවාහනය කළ යුතුව ඇති බවත්,
- මහව ඕමන්ත ව්‍යාපෘතියේ උපදේශක ආයතනයේ වාර්තා අනුව දෙපාර්තමේන්තුවට භාරදුන් රේල්පීලි අඩි 290,928ක් වුවද, දෙපාර්තමේන්තු වාර්තා අනුව රේල්පීලි අඩි 265,588ක් වීමෙන් රේල්පීලි අඩි 25,340ක ඌනතාවයක් පවතින බවත්, විගණනය විසින් පෙන්වා දෙන ලදී.

## b. ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) / ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්

සිල්පර මාර්ගය දෙපස තවමත් ගොඩ ගසා තිබීම නිසා ප්‍රවාහනය පිළිබඳ නිවැරදි සැලැස්මක් සාදා ගැනීමේ අපහසුතාවයක් පවතින බවත්, සේවා දුම්රියකින් මේවා ප්‍රවාහනය කළ යුතු බවත්, එක වතාවකදී ආසන්න වශයෙන් සිල්පර 400ක් හෝ රේල්පීලි 300ක් පමණ සුළු ප්‍රමාණයක් ප්‍රවාහනය කිරීමට හැකි වන නිසා මේ සඳහා සැලකිය යුතු කාලයක් ගත වන බවත්, සාමාන්‍ය දුම්රිය ධාවන කාල සටහන හේතුවෙන් මෙම කටයුතු සිදු කිරීමේදී ගැටළු මතු වී ඇති බවත් ප්‍රධාන ඉංජිනේරු (මාර්ග හා කර්මාන්ත) ප්‍රකාශ කර සිටියේය.

ඔමන්තේ ව්‍යාපෘතියට අදාල ගිවිසුමෙහි 7වන වගන්තියට අනුව, ගිවිසුම්ගත ආයතනය ව්‍යාපෘතියෙන් ඉවත්කරන දුම්රිය රේල්පීලි සහ සිල්පර ආසන්නම දුම්රිය ස්ථානයට ප්‍රවාහනය කරන බවටත්, ආසන්නම දුම්රිය ස්ථානය වෙනස් වන්නේ නම් ව්‍යාපෘති යෝජකයා විසින් දුම්රිය දෙපාර්තමේන්තුවට ඒ සඳහා ගෙවීමක් සිදු කළ යුතු බවටත් එහි සඳහන් වන බව ව්‍යාපෘති අධ්‍යක්ෂ පැවසීය.

නමුත්, ව්‍යාපෘතිය ප්‍රමාද වී ආරම්භ කිරීම, පියවර 1 හා පියවර 2 අතරතුර සැලකිය යුතු කාලයක් නොතිබීම, සාදා නිමකළ වහාම දුම්රිය ධාවනයට මාර්ගය යෙදවීම වැනි හේතුන් නිසා දෙපාර්තමේන්තුව හා අදාල පාර්ශ්වය අතර මුදල් නොගෙවීමේ එකඟතාවයකට එළඹුන බවත්, සිල්පර හා රේල්පීලි ප්‍රවාහනය නොකිරීම නිසා අනෙකුත් පාර්ශ්වයට ලැබුණු මූල්‍යමය වාසිය එම ආයතනයේ මීළඟ බිල්පතෙන් අය කර ගැනීමට කටයුතු සුදානම් කර ඇති බවත්, ව්‍යාපෘති අධ්‍යක්ෂ ප්‍රකාශ කළේය.

සිල්පර හා රේල්පීලිවලින් භාවිතයට ගත හැකි පීලි වර්ගීකරණය කොට වෙනත් දුම්රිය මාර්ග නඩත්තුව සඳහා යොදා ගන්නා බවත්, භාවිතයට ගත නොහැකි පීලි අදාල කමිටුවේ හා කර්මාන්ත අමාත්‍යාංශයේ නිර්දේශ මත යුධ හමුදාව, නාවික හමුදාව, බෝගල පතල වැනි රජයේ ආයතනවලට ලබා දෙන බවත්, කිසිදු රාජ්‍ය ආයතනයකට රේල්පීලි නොමිලේ ලබා නොදෙන බවත් නිලධාරීහු සඳහන් කළහ.

## c. කාරක සභාවේ නිරීක්ෂණ

ඉතිරි වැඩ කටයුතු ආරම්භ කිරීමට ඉන්දීය එක්සිම් බැංකුවේ ආධාර තවදුරටත් ලබා නොදෙන බැවින්, කැබිනට් මණ්ඩල අනුමැතිය ලබාගෙන විශේෂ කමිටුවක් පත් කර ශ්‍රී ලංකා රජයේ මුදල් ලබා දිය හැකි ද යන්න සාකච්ඡා කිරීමට නියමිත බවත්, එකී කමිටුව සතියක් තුළ පත් කරගෙන කැබිනට් අනුමැතිය ලබා ගෙන හැකි ඉක්මනින් මෙහි කටයුතු ආරම්භ කළයුතු බව කාරක සභාවේ නිරීක්ෂණය විය. මෙම කරුණ මීට පෙර පැවති

කාරක සභා වලදී ද සාකච්ඡා කර නිර්දේශ කරන ලද වාර්තාව මෙතෙක් ලබා නොදීම සම්බන්ධයෙන් කාරක සභාව සිය අප්‍රසාදය පළ කළාය.

**d. කාරක සභාවේ නිර්දේශ**

අඛන්ඩව සිදු වන සිල්පර හා රේල්පීලි බැහැර කිරීම හා නිසි පරිදි ස්ථානගත කිරීමට සැලසුමක් කාරක සභාව වෙත ලබා දිය හැකි වකවානුව පිළිබඳව සති 03ක් ඇතුළත (24.12.2025 වන විට) කාරක සභාව දැනුවත් කරන බවට ප්‍ර.ග.නි./ග.නි. කාරක සභාව සමඟ එකඟ විය.

**e. නිර්දේශ ඉටු කිරීමේ ප්‍රගතිය කාරක සභාව වෙත වාර්තා කිරීම**

- මහව හා අනුරාධපුර අතර දුම්රිය මාර්ගය අලුතින් ඉදිකිරීමේදී රාත්තල් 80 වර්ගයේ රේල් පීලි මීටර් 111,195.67ක්, රාත්තල් 90 වර්ගයේ රේල්පීලි මීටර් 22,474.63ක් හා කොන්ක්‍රීට් සිල්පර 85,719ක් මහව - අනුරාධපුර දුම්රිය මාර්ග කොටසෙන් ගලවා ඉවත් කෙරුණු බවත්,

- අද දින වන විට, ඉහත ගලවා ඉවත් කළ ද්‍රව්‍යවලින් සැලකිය යුතු කොටසක් වෙනත් මාර්ග කොටස් සංවර්ධන හා පුනරුත්ථාපන කටයුතු සඳහා බැහැර කර ඇති අතර, දැනට බැහැර කිරීම සඳහා පවතින්නේ රාත්තල් 80 වර්ගයේ පීලි මීටර් 72,330.42ක්, රාත්තල් 90 වර්ගයේ පීලි මීටර් 3,672.89ක් හා කොන්ක්‍රීට් සිල්පර 55,041ක් පමණක් වන බවත්,

- දුම්රිය මාර්ගයේ පාලම් අළුත් වැඩියා කටයුතු, දිට්වා සුළි කුණාටුවෙන් පසුව තාවකාලිකව පිළිසකර කරන ලද දුම්රිය මාර්ග කොටස්වල වැඩ කටයුතු නිම කිරීම හා අලින්ට ගමන් කිරීම සඳහා කාසිකොටේ ප්‍රදේශයේ ඉදිකරනු ලබන උමං පාලමේ ඉදිකිරීම් කටයුතු සඳහා එම ගලවා ඉවත් කරන ලද කොටස් භාවිතයට ගන්නා බවත්, ඇතුළත් වාර්තාවක්, MT/04/14/03/01-2025 (Vol-ii) හා 2026.02.16 දිනැති ලිපිය මගින් කාරක සභාව වෙත ඉදිරිපත් කර ඇත.

- මෙහි සම්පූර්ණ වාර්තාව ඉදිරිපත් කිරීමට MT/04/14/03/01-2025 හා 2025.12.17 දිනැති ලිපිය මගින් කාල දිගුවක් ඉල්ලා ඇති අතර එය 2026.06.30 දක්වා PS/LEG/COPA/02/Dept/(10)/04 හා 2026.01.05 දිනැති ලිපිය මගින් ලබා දී ඇත.

## 07) මහව සිට අනුරාධපුරය දක්වා වූ කොටසෙහි සංඥා පද්ධතිය.

❖ විමර්ශනය කරන ලද දිනය - 2025.05.09

### a. සාකච්ඡා කරන ලද කරුණු (විගණකාධිපති නිරීක්ෂණ අනුව)

මෙම මාර්ගය ඉදි කිරීම සඳහා කොන්ත්‍රාත්තුව පිරිනැමීමේදී මහව සිට අනුරාධපුරය දක්වා වූ කොටසෙහි සංඥා පද්ධතිය මෙම කොන්ත්‍රාත් විෂය පථයෙන් ඉවත් කර මාර්ග පද්ධතිය ඉදි කිරීම සඳහා පමණක් කොන්ත්‍රාත්තුව පිරිනමා තිබුණද, එහි සංඥා පද්ධතිය ඊට සමගාමීව ආරම්භ කර නොතිබුණු බවත්, දුම්රිය ධාවනය 2025 අප්‍රේල් මස සංඥා පද්ධතිය නොමැතිව ආරම්භ කර තිබූ බවත් සංඥා පද්ධතිය ඉදි කිරීම් ආරම්භ කර නොතිබීම හේතුවෙන් දුම්රිය මාර්ග පැයට කිලෝමීටර 100 ක වේගයෙන් පවත්වා ගැනීමේ අරමුණින් සැලසුම් කළද මෙම ගැටලුව හේතුවෙන් වේගය පැයට කිලෝමීටර 60 කට ආසන්න ප්‍රමාණයකින් දුම්රිය ධාවනය වීමෙන්, දුම්රිය මාර්ගය ඉදි කිරීමෙන් ළඟා කර ගැනීමට අපේක්ෂිත අරමුණු අත්කර ගැනීමට නොහැකි වී තිබෙන බව විගණනය විසින් පෙන්වා දෙන ලදී.

### b. ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) / ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්

දුම්රිය මාර්ගයේ එම කොටසෙහි සංඥා පද්ධතියට අදාළ ව්‍යාපෘතිය 2025 වසරේ මැයි (කාරක සභාව පැවැත්වූ මාසයේදීම) ආරම්භ කිරීමට කටයුතු සලසා ඇති බවත් දැනට සංඥා දෙපාර්තමේන්තුවේ මැදිහත්වීමෙන් සෙනරත්ගම, තලාව, ගල්ගමුව යන දුම්රිය ස්ථාන සඳහා මූලික සංඥා ක්‍රමයක් ලබා දී ඇති බවත් මහව - ඕමන්ත දක්වා දුම්රිය මාර්ග ඉදි කිරීමේ ව්‍යාපෘතියේ ව්‍යාපෘති අධ්‍යක්ෂක කාරක සභාව හමුවේ ප්‍රකාශ කළේය.

### c. කාරක සභාවේ නිරීක්ෂණ

මෙම මාර්ගය ඉදිකිරීමේ ආරම්භක සැලැස්මට සංඥා පද්ධතිය ඇතුළත් කර නොතිබීමෙන් වියදම වැඩි වී ඇති බවත් නිවැරදි ශක්‍යතා අධ්‍යයනයක් සිදු නොකර මෙවැනි ව්‍යාපෘති ආරම්භ කිරීම ගැටලුකාරී තත්ත්වයට හේතු වී ඇති බව කාරක සභාව විසින් නිරීක්ෂණය කරන ලදී.

### d. කාරක සභාවේ නිර්දේශ

මෙම විගණන කරුණ සඳහා කාරක සභාව විසින් නිර්දේශයක් ඉදිරිපත් නොකෙරිණි.

### e. නිර්දේශ ඉටු කිරීමේ ප්‍රගතිය කාරක සභාව වෙත වාර්තා කිරීම

අදාළ නොවේ.

## 08) වන අලි දුම්රියේ ගැටීම.

❖ විමර්ශනය කරන ලද දිනය - 2025.05.09

### a. සාකච්ඡා කරන ලද කරුණු (විගණකාධිපති නිරීක්ෂණ අනුව)

වන අලි අනතුරු අවම කර ගැනීම සඳහා වනජීවී දෙපාර්තමේන්තුව සමඟ ඒකාබද්ධව 2018 ඔක්තෝබර් 11 දින සිට 15 දින දක්වා සමීක්ෂණයන් සිදුකර වනඅලි දුම්රියේ ගැටුණු ස්ථාන හා වනඅලි දුම්රිය මාර්ගයේ ගැවසෙන ස්ථාන පිළිබඳව අධ්‍යයනයක් සිදුකර තිබුණත් වනඅලි ගැටීම් අවම කර ගැනීමට කටයුතු කර නොතිබුණි. ඒ හේතුවෙන් දුම්රියේ වන අලි ගැටීමෙන් වන අනතුරු වර්තමානය වන විට මහත් ඛේදවාචකයක් බවට පත්ව ඇති අතර 2020 වර්ෂයේ සිට 2024 දක්වා වූ අවුරුදු 05 ක කාලය තුල දුම්රියේ ගැටීම නිසා මිය ගිය වන අලි සංඛ්‍යාව 53ක් ද තුවාල ලද වන අලි සංඛ්‍යාව 17ක් වාර්තා වී ඇති බව විගණනය විසින් ඉදිරිපත් කරන ලදී.

### b. ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) / ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්

පසුගිය වසර 25ක කාල සීමාවේදී වන අලි දුම්රියේ ගැටීමෙන් මරණ 138 ක් වාර්තා වී ඇති බවත්, අලි හුවමාරු වන ස්ථානවල විශාල විසිරියක් පවතින බවත්, ව්‍යාපෘතිය සිදු කළ කාලසීමාව තුළ මෙය ප්‍රවර්ධනය වී ඇති බවත් එහි ව්‍යාපෘති අධ්‍යක්ෂක කාරක සභාව හමුවේ ප්‍රකාශ කළේය.

මෙම ගැටළුවට විසඳුම් ලෙස අලින්ට මාරු වීමට හැකියාව ඇතිව මීටර් 5 ක් පමණ උසකින් උමං මාර්ග ඉදිකිරීම, නව නිපැයුම්කරුවන්ගේ සංගමය සමග සාකච්ඡා කර විසඳුම් සෙවීම වැනි දිගුකාලීන විසඳුම් ද, නව බලවේග කට්ටල භාවිතය මගින් කෙටි දුරකදී දුම්රිය නවත්වා ගැනීමට සැලසීම, දෙපස වන පෙදෙස් කපා ඉවත් කිරීම මගින් හොඳින් මාර්ගය දර්ශනය වීමට සැලැස්වීම, අලි හුවමාරු වන ස්ථාන දර්ශනය කරමින් තිබූ නාම පුවරු රියදුරු මහතුන්ට හොඳින් දර්ශනය වනසේ පිළිසකර කිරීම හා වන අලි ගැවසෙන ස්ථාන සම්බන්ධයෙන් වනජීවී දෙපාර්තමේන්තුවෙන් සිදු කරනු ලබන දැනුවත් කිරීම් වලට රියදුරන් සහභාගී කරවීම වැනි කෙටි කාලීන ක්‍රියාමාර්ග ද දැනට හඳුන්වා දී ඇති බව ගණන්දීමේ නිලධාරි කාරක සභාව හමුවේ ප්‍රකාශ කර සිටියේය.

### c. කාරක සභාවේ නිරීක්ෂණ

මෙම අනතුරු වලක්වා ගැනීමට ඉක්මන් ක්‍රියාමාර්ග ගතයුතු බව කාරක සභාවේ නිරීක්ෂණය විය.

### d. කාරක සභාවේ නිර්දේශ

මෙම විගණන කරුණ සඳහා කාරක සභාව විසින් නිර්දේශයක් ඉදිරිපත් නොකෙරිණි.

### e. නිර්දේශ ඉටු කිරීමේ ප්‍රගතිය කාරක සභාව වෙත වාර්තා කිරීම

අදාළ නොවේ.

## 09) දෙපාර්තමේන්තුවට අයවිය යුතු හිඟ ආදායම් අය කර ගැනීම.

❖ විමර්ශනය කරන ලද දිනය - 2025.05.09

### a. සාකච්ඡා කරන ලද කරුණු (විගණකාධිපති නිරීක්ෂණ අනුව)

දුම්රියෙන් හුණුගල් ප්‍රවාහනය වෙනුවෙන් සියැම් සිටි සිමෙන්ති (ලංකා) සමාගමෙන් 2024 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු හිඟ ආදායම් රු.2,187,326ක් බවත්, දුම්රිය මඟින් භාණ්ඩ ප්‍රවාහනය කිරීම වෙනුවෙන් 2024 දෙසැම්බර් 31 දිනට ආයතන 31 කින් රු.169,769,006ක මුදලක් හිඟ වශයෙන් ඇති අතර ඉන් ආයතන 20 කින් ලැබිය යුතු රු.23,457,706ක මුදල් වර්ෂ 07 සිට 44 දක්වා පැරණි ශේෂයන් බවත්, 2024 දෙසැම්බර් 31 දිනට ඇති දුම්රිය බලපත්‍ර හිඟ ආදායම රු.1,256,596,206ක්වූ අතර දුම්රිය දෙපාර්තමේන්තු බඩු ගබඩා ආදායම, ස්ථාවර භෝජනාගාර, වෙළඳ දැන්වීම්, ප්‍රචාරණය හා සුළු වෙළඳ සැල් සම්බන්ධයෙන් හිඟ ආදායම රු.519,930,236ක් වන බවත්, දුම්රිය මගින් භාණ්ඩ ප්‍රවාහනය කිරීම වෙනුවෙන් 2021 වර්ෂය අවසාන වන විට ආයතන 47 කින් රු.140,784,351ක් ද, 2020 වර්ෂයේ දුම්රිය බලපත්‍ර හිඟ ආදායම රු.848,334,880ක් ද, 2020 වර්ෂයේ වෙනත් හිඟ ආදායම් රු.556,205,725ක් සහ කඩ කාමර හා බඩු ගබඩා 03 ක හිඟ කුලිය රු.36,790,032ක් ද වශයෙන් රු.1,582,114,988ක්ද වන බව විගණනය විසින් පෙන්වාදෙන ලදී.

### b. ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) / ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම

2023 රජයේ ගිණුම් කාරක සභාවේදී ලබා දුන් නිර්දේශයකට අනුව හරස් සටහන් ක්‍රමය භාවිතා කරමින් මුදල් අය කර ගැනීම දැනට සිදු කරනු ලබන

අතර එමගින් 2024 වසරේ රු. මිලියන 3283ක් ද (98%ක් ) 2023 වසරට අදාළ බලපත්‍ර 2845 අතුරින් 2641ක හිඟ මුදල් ද අයකර ගැනීමට හැකියාව ලැබී ඇති බවත්, පසුගිය වසර කිහිපය තුළ රජයේ ආයතනවලට ප්‍රමාණවත් ප්‍රතිපාදන නොලැබීම හේතුවෙන් හිඟ බලපත්‍ර ගාස්තු අයකර ගැනීමට නොහැකි වූ බවත් දුම්රිය දෙපාර්තමේන්තුවේ ප්‍රධාන මූල්‍ය නිලධාරී කාරක සභාව හමුවේ ප්‍රකාශ කර සිටියාය.

එමෙන්ම වෙළඳ දැන්වීම් ප්‍රචාරණය සම්බන්ධයෙන් 2000 වසරේදී යම් ආයතනයක් සමග ගිවිසුම් ගත වුවද එම ගිවිසුම ප්‍රකාරව මුදල් නොගෙවීම හේතුවෙන් නීතිමය කටයුතු සඳහා යොමු වී ඇති බවත්, දෙපාර්තමේන්තු අවසරයකින් තොරව බදුල්ල දුම්රිය ස්ථානයේ විවේක කාමර සඳහා ටෙන්ඩර් ලබා දීම සම්බන්ධයෙන් අදාළ නිලධාරියාට එරෙහිව විනය පියවර ගෙන ඇති බවත් දුම්රිය දෙපාර්තමේන්තු නිලධාරීන් කාරක සභාව හමුවේ ප්‍රකාශ කළහ.

එමෙන්ම දුම්රිය දෙපාර්තමේන්තුවේ ඇති ආදායම් උපයන වත්කම් පිළිබඳ දත්ත පද්ධතියක් පවත්වාගෙන යන බවට ප්‍ර.ග.නි ප්‍රකාශ කර සිටියේය.

### c. කාරක සභාවේ නිරීක්ෂණ

දුම්රිය මගින් භාණ්ඩ ප්‍රවාහනය, දුම්රිය බලපත්‍ර ගාස්තු, කඩ කාමර හා බඩු ගබඩා කුලිය හා වෙනත් කටයුතු වෙනුවෙන් දෙපාර්තමේන්තුවට අය විය යුතු හිඟ ආදායම් අයකර ගැනීමේ දුර්වලතාවයක් පවතින බව කාරක සභාව නිරීක්ෂණය කරන ලදී.

### d. කාරක සභාවේ නිර්දේශ

දුම්රිය බලපත්‍ර හිඟ ආදායම්වල වර්තමාන තත්ත්වය පිළිබඳ සම්පූර්ණ වාර්තාවක් විගණකාධිපති වෙත ලබා දෙන ලෙස දෙපාර්තමේන්තුවේ ග.නි. වෙත කාරක සභාව නිර්දේශ කළාය.

### e. නිර්දේශ ඉටු කිරීමේ ප්‍රගතිය කාරක සභාව වෙත වාර්තා කිරීම

දුම්රිය බලපත්‍ර හිඟ ආදායම්වල වර්තමාන තත්ත්වය පිළිබඳව සම්පූර්ණ වාර්තාවක් M/04/14/03/01-2025 හා 2025.06.04 දිනැති ලිපියට අදාළ වාර්තාවේ ඇමුණුම 07 මගින් කාරක සභාවට ඉදිරිපත් කර ඇත.

❖ <u>විමර්ශනය කරන ලද දිනය - 2025.11.27</u>

**a. සාකච්ඡා කරන ලද කරුණු (විගණකාධිපති නිරීක්ෂණ අනුව)**

2020 වර්ෂයේ දුම්රිය බලපත්‍ර හිඟ ආදායම රු. 848,334,880 ක් අයකර ගෙන නොතිබීම සම්බන්ධයෙන් කමිටුව සාකච්ඡා කළ අතර දුම්රිය බලපත්‍ර හිඟ ආදායම් වල වර්තමාන තත්ත්වය පිළිබඳ තොරතුරු ඇතුළත් වාර්තාව 2025 ජූනි 03 දින විගණකාධිපති වෙත ඉදිරිපත් කර ඇති බවත්,

දුම්රිය බලපත්‍ර හිඟ ආදායමට අදාළව, බලපත්‍ර 1 ගිණුම අනුව 2020 දෙසැම්බර් 31 දිනට පවතින ශේෂය රු.769,194 ක් වූ අතර එය 1987 ට පෙර සිට පවතින ශේෂයන් බවත්, ඒ සම්බන්ධ ලේඛන මේ වන විට සොයා ගැනීමට නොහැකි බවත් දක්වා තිබුණු බවත්,

බලපත්‍ර 2 ගිණුමේ 2025 සැප්තැම්බර් 30 දිනට හිඟ ශේෂය රු.956,110,609ක් බවත්, වාර්තාවේ දක්වා ඇති බව විගණනය විසින් පෙන්වා දෙන ලදී.

**b. ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) / ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්**

එදින වන විට හිඟ බලපත්‍ර ආදායම රුපියල් මිලියන 966ක් වන බවත් වැඩිම ප්‍රතිශතය දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව දැරිය යුතු බවත්, එය රුපියල් මිලියන 103ක් වන බවත්, මේ සම්බන්ධයෙන් අදාළ ආයතන ලිඛිතව දැනුවත් කර ඇති බවත්, පළමුව මෙම වර්ෂයේ හිඟ බලපත්‍ර ගාස්තු අයකර ගැනීමට ද පසුව පෙර වර්ෂවල හිඟ බලපත්‍ර ගාස්තු අයකර ගැනීමට සිහිකැඳවීම් සිදුකරන බවත්, 2025 වර්ෂයට අදාල හිඟ මුදල මෙම වර්ෂය තුළම අය කර ගැනීමට කටයුතු කරන බවත්, මෙම හිඟ මුදල් අයකර ගැනීමට භාණ්ඩාගාරයේ සහය ද ලබා ගැනීමට අපේක්ෂා කරන බවත් ග.නි. ප්‍රකාශ කර සිටියේය.

දුම්රිය දෙපාර්තමේන්තුවේ ප්‍රධාන මුල්‍ය නිලධාරිනිය ප්‍රකාශ කර සිටියේ 2016 වසරේ සිට හිඟ මුදල් පවතින බවත්, සමහර ආයතනවලින් ලැබුණු චෙක්පත් උපලබ්ධි වුවා දැයි බැලීමට කිසිදු පද්ධතියක් දැනට නොමැති බැවින්, නැවත වතාවක් ඒවා පරික්ෂා කොට යාවත්කාලීන තොරතුරු ලබා ගැනීමට දැනට සාකච්ඡා කර ඇති බවත්ය.

**c. කාරක සභාවේ නිරීක්ෂණ**

භාණ්ඩාගාරය සමඟ සාකච්ඡා කර හිඟ මුදල් අය කර ගැනීම සඳහා සුදුසු ක්‍රමවේදයක් සකස් කර ගත යුතු බව කාරක සභාවේ නිරීක්ෂණය විය.

**d. කාරක සභාවේ නිර්දේශ**

භාණ්ඩාගාරය සමඟ සාකච්ඡා කර හිඟ මුදල් අය කර ගැනීමට ක්‍රමවේදයක් සකස් කර මසක් ඇතුළත (31.12.2025 වන විට) කාරක සභාවට ඉදිරිපත් කිරීමට ප්‍ර.ග.නි./ග.නි. කාරක සභාව සමඟ එකඟ විය.

**e. නිර්දේශ ඉටු කිරීමේ ප්‍රගතිය කාරක සභාව වෙත වාර්තා කිරීම**

MT/04/14/03/01-2025 හා 2026.01.05 දිනැති ලිපිය මගින් වාර්තාවක් කාරක සභාව වෙත ඉදිරිපත් කර ඇත. ඒ අනුව පළමුව ආයතන 12ක් තෝරාගෙන එම ආයතනවලට අදාළව 2025/11/27 දිනට පැවති රු.406,830,587.00 ශේෂයෙන් රු.75,833,816.00ක මුදලක් (18.61% ප්‍රතිශතයක්) අයකරගෙන ඇත. අනෙකුත් ආයතනවලට අදාල හිඟ ශේෂයෙන් රු.105,999,100.00ක් අය කර ගැනීමට හැකිවිය. කාරක සභාව පවත්වා මාසයක කාලයක් තුල හිඟ මුදල රු.181,832,915.87කින් අඩු කර ගැනීමට හැකිවී ඇත.

10) **දුම්රිය දෙපාර්තමේන්තුව සතු ඉඩම්/ දේපල ඇතුළත් දත්ත පද්ධතියක් ස්ථාපිත නොකිරීම/ දේපල නිසි පරිදි ලේඛනගත නොකිරීම.**

❖ <u>විමර්ශනය කරන ලද දිනය - 2025.05.09</u>

**a. සාකච්ඡා කරන ලද කරුණු (විගණකාධිපති නිරීක්ෂණ අනුව)**

දුම්රිය දෙපාර්තමේන්තුව සතු ඉඩම්/ වත්කම් පිළිබඳව දත්ත ඇතුළත් තොරතුරු පද්ධතියක් ස්ථාපිත කිරීම පිළිබඳ වාර්තාවක් 2024 අගෝස්තු 05 දින වනවිට කාරක සභාව වෙත යොමු කරන ලෙසත් දෙපාර්තමේන්තුව සතු ඉඩම්වල අනවසර පදිංචිවීම් හා ලියාපදිංචිවීම් සංඛ්‍යාව පිළිබඳව සකස් කළ සම්පූර්ණ වාර්තාවක් 2024 සැප්තැම්බර් 15 දින වන විට කාරක සභාව වෙත යොමු කරන ලෙසත් ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශයේ ප්‍ර.ග.නි./ ග.නි. වෙත කාරක සභාව විසින් 2024 වසරේ පැවති කාරක සභාවේදී නිර්දේශ කර තිබූ අතර, 2024 සැප්තැම්බර් 18 වන දින අදාළ වාර්තාව ඉදිරිපත් කර තිබුණු බව විගණනය විසින් කාරක සභාව හමුවේ ප්‍රකාශ කරන ලදී. එමෙන්ම අනවසර පදිංචිකරුවන් ලියාපදිංචි කර ගැනීම සඳහා පුවත්පත් දැන්වීම් පල කර ස්වේච්ඡාවෙන් ලියාපදිංචි වීමට අවස්ථාව ලබාදී තිබුණද, සියලුම අනවසර පදිංචිකරුවන් හඳුනාගැනීමේ ක්‍රමවත් වැඩපිළිවෙලක් සකස් කර නොතිබුණු බවත්, මාර්ගගත ක්‍රමය ඔස්සේ ලියාපදිංචි වී ඇති පරිහරණකරුවන් නියමානුකූල කිරීමේ කටයුතු මේ වන විට ආරම්භ කර ඇති අතර, 2024.09.11 වන විට ලියාපදිංචි වී ඇති සංඛ්‍යාව 2646ක් බවත් විගණනය විසින් පෙන්වා දෙන ලදී.

### b. ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) / ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්

පැරණි සිතියම්ගත කිරීමක් පැවතිය ද තදාසන්න දුම්රිය ස්ථාන ආසන්නයේ පමණක් නව ඩිජිටල් සිතියම්ගතකරණයක් සිදුකර ඇති බව දුම්රිය දෙපාර්තමේන්තුව සතු ඉඩම් සිතියම්ගත කිරීම සම්බන්ධව එහි ගණන්දීමේ නිලධාරියා ප්‍රකාශ කර සිටියේය.

### c. කාරක සභාවේ නිරීක්ෂණ

දෙපාර්තමේන්තුව සතු දේපල/ඉඩම් නිවැරදිව හඳුනාගෙන ලේඛනගත කිරීම සිදු කළ යුතු බවත් එම දේපල කුලී/බදු පදනමට ලබාදීමෙන් දෙපාර්තමේන්තුවට විශාල අදායමක් උපයා ගැනීමේ හැකියාව පවතින බවත් පෙන්වා දුන් කාරක සභාව අනවසරයෙන් භුක්ති විඳිනු ලබන ඉඩම්/දේපල වලින් එම අනවසරකරුවන් ඉවත් කිරීම හෝ බදු අයකිරීම සිදු කළ යුතු බව නිරීක්ෂණය කරන ලදී.

### d. කාරක සභාවේ නිර්දේශ

දුම්රිය දෙපාර්තමේන්තුව සතු ඉඩම් පිළිබඳ පහත කරුණු ඇතුළත් සවිස්තර වාර්තාවක් මාස 3ක් ඇතුළත (2025.08.11 දින වන විට) කාරක සභාවට ඉදිරිපත් කරන ලෙස අමාත්‍යාංශයේ ප්‍ර.ග.නි./ග.නි වෙත කාරක සභාව නිර්දේශ කළේය.

- දුම්රිය දෙපාර්තමේන්තුව සතු ඉඩම් පිළිබඳ තොරතුරු
- ඒ අතුරින් බදු පදනම මත ලබා දී ඇති ඉඩම් හා ඉන් ලබන ආදායම් පිළිබඳ තොරතුරු
- ඒ අතුරින් අනවසර පදිංචිවීම් සහිත ඉඩම් හා එම ඉඩම් අනවරසරයෙන් භුක්ති විඳිනුයේ කවුරුන්ද යනාදි තොරතුරු

### e. නිර්දේශ ඉටු කිරීමේ ප්‍රගතිය කාරක සභාව වෙත වාර්තා කිරීම

දුම්රිය දෙපාර්තමේන්තුව සතු ඉඩම්, බදු පදනම මත ලබා දී ඇති ඉඩම්, අනවසර පදිංචිවීම් සහිත ඉඩම් හා එම ඉඩම් අනවරසරයෙන් භුක්ති විඳිනුයේ කවුරුන්ද යනාදි තොරතුරු පිළිබඳ වාර්තාව MT / 04 /14 / 03 / 01-2025 හා 2025.08.12 දිනැති ලිපිය මඟින් කාරක සභාවට ඉදිරිපත් කර ඇත. එහිදී දුම්රිය රක්ෂිතවල සිටින අනවසර පදිංචිකරුවන් කවුරුන්ද යන්න හඳුනාගත හැකි වනුයේ දුම්රිය රක්ෂිත ඉඩම් සියල්ල මැනුම් කටයුතු සිදු කිරීමෙන් පසුවය. මේ සඳහා දුම්රිය දෙපාර්තමේන්තුවේ මැනුම් නිලධාරීන් ප්‍රමාණවත්

නොවන බැවින් මුදල් අමාත්‍යාංශය මඟින් කෘෂිකර්මය, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශයේ මිනින්දෝරුවරුන් ඉල්ලා ඇති අතර මාස 06ක් ඇතුළත මානව සම්පත් සම්පූර්ණ කර මැනුම් කටයුතු සිදු කරනු ලබන ආකාරය පිළිබඳ සැලැස්මක් සකස් කර ඉදිරිපත් කර ඇත.

❖ විමර්ශනය කරන ලද දිනය - 2025.06.05

**a. සාකච්ඡා කරන ලද කරුණු (විගණකාධිපති නිරීක්ෂණ අනුව)**

සිලෝන් පෙට්‍රෝලියම් ස්ටෝරේජ් ටර්මිනල්ස් ලිමිටඩ් (CPSTL) ආයතනයට ඛනිජතෙල් පිරවුම්හල් පවත්වාගෙන යාම සඳහා බදුල්ල, කොටගල, කුරුණෑගල, මාතර, පේරාදෙණිය, හපුතලේ, අනුරාධපුර, සරසවි උයන හා මඩකලපුව යන ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ රක්ෂිත ඉඩම් 09 ක් බදු ගිවිසුම් වලට එළඹීමෙන් තොරව ලබාදී තිබුණු අතර 2014 වර්ෂයේ සිට 2024 දෙසැම්බර් 31 දිනට අදාල ආයතන වෙතින් අයවිය යුතු රු.125,830,155 ක්වූ හිඟ බදු ආදායම් අයකරගෙන නොතිබුණු බව විගණනය විසින් පෙන්වා දෙන ලදී.

**b. ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) / ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්**

නිවැරදි කර ගැනීමට කටයුතු කරන බව ගණන් දීමේ නිලධාරියා ප්‍රකාශ කළේය.

**c. කාරක සභාවේ නිරීක්ෂණ**

ඉඩම්/ගොඩනැගිලි බදු දීම මගින් දෙපාර්තමේන්තුවට ලැබෙන අදායම අහිමි කර නොගත යුතු බව කාරක සභාවේ නිරීක්ෂණය විය.

**d. කාරක සභාවේ නිර්දේශ**

දුම්රිය දෙපාර්තමේන්තුවට අයත් ඉඩම් බදු දීම සම්බන්ධව පවතින අකාර්යක්ෂමතාවය පිටුදැකීම සඳහා ගත හැකි ක්‍රියාමාර්ග ඇතුළත් වාර්තාවක් කාරක සභාවට ඉදිරිපත් කරන ලෙස දුම්රිය දෙපාර්තමේන්තුවේ ගණන් දීමේ නිලධාරියා වෙත නිර්දේශ කරන ලදි.

**e. නිර්දේශ ඉටු කිරීමේ ප්‍රගතිය කාරක සභාව වෙත වාර්තා කිරීම**

නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (වාණිජ) කාර්යාලය විසින් බදු ලබා දී ඇති සක්‍රීය බදු ගොනු ප්‍රමාණය හඳුනා ගැනීම සඳනා එම ගොනු පරිගණකගත කරන ලද

අතර ඒ අනුව ගොනු 6500කට ආසන්න ප්‍රමාණයක් පවතින බව හඳුනා ගෙන ඇත. MT/04/14/03/01-2025 හා 2025.11.13 දිනැති ලිපිය මගින් ඉදිරිපත් කර ඇති වාර්තාවේ, ඉඩම් බදුදීම ක්‍රමවත් කිරීම සඳහා හඳුන්වා දුන් පරිගණක මෘදුකාංග අනුව ලබාගත් දත්තයන්ද (ඇමුණුම28 - I) එහි විස්තරාත්මක වාර්තාවද (ඇමුණුම28 -II) ඉදිරිපත් කර ඇත.

❖ <u>විමර්ශනය කරන ලද දිනය - 2025.11.27</u>

**a. සාකච්ඡා කරන ලද කරුණු (විගණකාධිපති නිරීක්ෂණ අනුව)**

පෙර පැවති කාරක සභා විසින් ලබාදුන් නිර්දේශ අනුව, දුම්රිය දෙපාර්තමේන්තුව සතු ඉඩම්, බදු පදනම මත ලබාදී ඇති ඉඩම් හා එමඟින් ලබන ආදායම්, අනවසර පදිංචිවීම් සහිත ඉඩම්, අනවසර භුක්ති විඳින්නන් යනාදී තොරතුරු ඇතුළත් වාර්තාවක් ලබා දී ඇති බවත්, එයට අනුව දෙපාර්තමේන්තුව සතු සමස්ත ඉඩම් ප්‍රමාණය අක්කර 14,129ක් වන බවත්, දුම්රිය මාර්ග, දුම්රිය ස්ථාන, ධාවනාගාර හා කාර්යාල සඳහා අක්කර 8,265ක් වෙන්වී තිබූ බවත්, තවදුරටත් බදු වශයෙන් ලබා දිය හැකි ඉඩම් ප්‍රමාණය අක්කර 4,395ක් බවත්, පෙන්වා දී ඇත. එසේම ගොනු දත්ත අනුව බදු ලබාදී තිබූ ප්‍රමාණය අක්කර 1,520ක් වන බවත්, බදු දීමෙන් 2024 වර්ෂය තුළදී රු.මිලියන 220ක් ද 2025 ජූනි වන තෙක් රු.මිලියන 123ක් ආදායම් ලෙස උපයා ගෙන ඇති බවත්, බදු දෙන ලද ඉඩම්වලට අදාලව නඩත්තු කරන ලිපිගොනු 12,562කින් බදු ඉඩම් 6,305කට අදාළ ලිපිගොනු පමණක් කළමනාකරණ තොරතුරු පද්ධතියට ඇතුළත් කර තිබෙන බවත්, එහි සඳහන් වන බව විගණනය විසින් පෙන්වා දෙන ලදී. එමෙන්ම, අනවසර පදිංචිවීම් සහිත ඉඩම් හා අනවසර පදිංචිකරුවන් පිළිබඳ තොරතුරු එම වාර්තාවේ ඇතුළත් නොවන බවත්, විගණනය පෙන්වා දෙන ලදී.

පොලොන්නරුව - කදුරුවෙල දුම්රිය ස්ථානයට යාබද ඉඩමේ සාදා ඇති විශාල දෙමහල් ගොඩනැගිල්ල දීර්ඝ කාලයක සිට කිසිඳු ප්‍රයෝජනයකට නොගෙන අතහැර දමා ඇති බව කාරක සභාවේ අවධානයට යොමු වූ අතර වෙළඳ අමාත්‍යාංශය මෙම ගොඩනැගිල්ල අදාල මාසික ගාස්තු ගෙවා "සතොස" ආයතනය පවත්වාගෙන යාමට ඉල්ලුම් කිරීම පිළිබඳව විමසන ලදී.

2024.09.18 වන දින පොලොන්නරුව - කදුරුවෙල දුම්රිය ස්ථානය ඉදිරියේ පිහිටා තිබූ ලීටර් 45, 000කට වඩා තෙල් ගබඩා කළ හැකි තෙල් ටැංකි 3න් මතුපිට තිබූ තෙල් ටැංකි 2ක් ටෙන්ඩර් කැඳවා විකුණනු ලැබූවත්, එම ටැංකි තවත් අවු.100ක් පමණ භාවිතයට ගත හැකිව තිබූ බවත්, ඊට අමතරව අනෙක් භූගත ටැංකිය ද රැගෙන යාම හේතුවෙන් ප්‍රදේශවාසීන් විසින් පොලිසියට පැමිණිලි කළ ද තම දේපලක් වූ මෙය රැකගැනීමට දුම්රිය දෙපාර්තමේන්තුව මගින් කිසිඳු ක්‍රියාමාර්ගයක් මේ දක්වා ගෙන නොමැති වීම පිළිබඳව කාරක සභාව විමසිය.

### b. ප්‍රධාන ගණකන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) / ගණකන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්

ඉහතින් සඳහන් කරන ලද බදු ඉඩම් 6,305කට අදාළ ලිපිගොනු, බදු කටයුතු සම්බන්ධ ලිපිගොනු බවත්, බදු ඉල්ලුම් කරන ලද තාවකාලික ලිපිගොනු (ඉල්ලුම්කරු ප්‍රතිචාර දක්වා නොමැති) රාශියක් මෙහි ඇතුළත් වන බවත් (ආසන්න වශයෙන් 4000ක් පමණ), අක්‍රිය ලිපිගොනු ද මෙයට අයත් බවත්, ආදායම් ලබන බදුගොනු දත්ත සියල්ලම මේ වනවිට පද්ධතියට ඇතුළත් කර ඇති බවත්, දෙපාර්තමේන්තුවේ කළමනාකරණ තොරතුරු පද්ධතිය 2026 ජුනි පමණ වන විට සාදා නිම කිරීමට බලාපොරොත්තු වන බවත් එවිට මෙම ගැටළු රාශියකට පිළිතුරු ලබාගත හැකි බවත්, එමඟින් දෙපාර්තමේන්තුවේ ඉඩම් බදු දීමේ කටයුතු කාර්යක්ෂමව කරගෙන යාමට බලාපොරොත්තුවන බවත් නිලධාරීහු ප්‍රකාශ කර සිටියහ.

පොලොන්නරුව ආශ්‍රිතව කරන ලද සංවර්ධන කටයුත්තකදී එක්තරා ආකාරයක හිලව් ගොඩනැගිල්ලක් ලෙස මෙම ගොඩනැගිල්ල නාගරික සංවර්ධන අධිකාරිය මගින් සාදා ඇති බවත්, එය මීට පෙර අවස්ථා දෙකකදී ටෙන්ඩර් කැඳවා භාවිතයට ලබා දුන්නද ටෙන්ඩර් හිමිකරුට එය පවත්වාගෙන යාමට නොහැකි වූ බවත්, වෙනත් රජයේ ආයතනයකට හෝ ලබා දීමේ ගැටළුවක් නොමැති බවත් නිලධාරීහු ප්‍රකාශ කළහ.

තෙල් ටැංකි දුම්රිය දෙපාර්තමේන්තු භූමියේ ස්ථාපනය කර තිබුන ද, ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට අයත් දේපලක් බව නිලධාරීහු කාරක සභාව හමුවේ ප්‍රකාශ කර සිටියහ.

දුම්රිය දෙපාර්තමේන්තුව සතු ඉඩම්වල මැනුම් කටයුතු සිදුකිරීම සම්බන්ධව විමසුම් කිරීමේදී එහි නිලධාරීන් ප්‍රකාශ කර සිටියේ, දෙපාර්තමේන්තුව සතුව දැනට සිටිනුයේ මිනින්දෝරුවන් 05 දෙනෙකු පමණක් බැවින් ඉදිරියේදී මැනුම් කටයුතු බාහිර පාර්ශ්වයකට ලබා දීමට කළමනාකරණ හා විගණන කමිටුවලදී සාකච්ඡා කර ඇති බවත්, මැනුම් කටයුතු සිදු කරනු ලබන ආකාරය පිළිබඳ සැලැස්මක් මේ වනවිට සකස් කර ඇති බවත්ය.

### c. කාරක සභාවේ නිරීක්ෂණ

දුම්රිය දෙපාර්තමේන්තුව සතු ඉඩම් බදු දීමේදී, බදු ගිවිසුමේ සඳහන් කාර්යයට පරිබාහිරව ඉඩම් භාවිතා කරන්නේ නම්, ඊට අදාලව ගන්නා ක්‍රියාමාර්ග පිළිබඳව දෙපාර්තමේන්තුව නිසි අවධානයක් යොමුකර නොමැති බව කාරක සභාව නිරීක්ෂණය කරන ලදී.

**d. කාරක සභාවේ නිර්දේශ**

1. බදු ගිවිසුමේ සඳහන්වන භාවිතයන්ට අමතරව බදු ඉඩම් වෙනත් පරිභෝජනයකට යොදා ගන්නේ නම්, එම ඉඩම නැවත තක්සේරුකර අදාළ නියමිත බදු මුදල් අයකර ගැනීමට සැලැස්මක් පිළියෙළකර මසක් ඇතුළත (31.12.2025 වන විට) කාරක සභාවට ඉදිරිපත් කිරීමට ප්‍ර.ග.නි./ග.නි. කාරක සභාව සමඟ එකඟ විය.

2. වලංගු බදු ගිවිසුමක් නොමැති ඉඩම් සම්බන්ධයෙන් වලංගු බදු ගිවිසුමක් ඇතිකර ගැනීම පිළිබඳ සැලැස්මක් මාසයක් ඇතුළත (31.12.2025 වන විට) කාරක සභාවට ඉදිරිපත් කිරීමට ප්‍ර.ග.නි./ග.නි. කාරක සභාව සමඟ එකඟ විය.

3. පොලොන්නරුව - කදුරුවෙල දුම්රිය ස්ථාන පරිශ්‍රයට යාබද ඉඩමේ අලුතින් ඉදි කර ඇති, දැනට නිසි ලෙස භාවිතයට නොගන්නා දෙමහල් ගොඩනැගිල්ල රජයේ ආයතනයකට බදු දීම හෝ වෙනත් වඩාත් වාසිදායක ක්‍රියාමාර්ගයක් සම්බන්ධව සාකච්ඡාකර මසක් ඇතුළත (31.12.2025 වන විට) කාරක සභාවට වාර්තා කිරීමට ප්‍ර.ග.නි./ග.නි. කාරක සභාව සමඟ එකඟ විය.

4. පොලොන්නරුව - කදුරුවෙල දුම්රිය ස්ථාන පරිශ්‍රය ඉදිරියේ තිබූ ලීටර් 45,000ක තෙල් ගබඩා කළ හැකි ටැංකි 3හි අයිතිය හා එම ටැංකි සම්බන්ධයෙන් ගෙන ඇති/ගැනීමට ඇති ක්‍රියාමාර්ග පිළිබඳව වාර්තාවක් මසක් ඇතුළත (31.12.2025 වන විට) කාරක සභාවට ඉදිරිපත් කිරීමට ප්‍ර.ග.නි./ග.නි. කාරක සභාව සමඟ එකඟ විය.

5. පොලොන්නරුව - කදුරුවෙල දුම්රිය ස්ථාන පරිශ්‍රය ඉදිරියේ තිබූ ලීටර් 45,000ක තෙල් ගබඩා කළ හැකි ටැංකි 3හි අයිතිය හා එම ටැංකි සම්බන්ධයෙන් ගෙන ඇති/ගැනීමට ඇති ක්‍රියාමාර්ග පිළිබඳව වාර්තාවක් මසක් ඇතුළත (31.12.2025 වන විට) කාරක සභාවට ඉදිරිපත් කිරීමට ප්‍ර.ග.නි./ග.නි. කාරක සභාව සමඟ එකඟ විය.

**e. නිර්දේශ ඉටු කිරීමේ ප්‍රගතිය කාරක සභාව වෙත වාර්තා කිරීම**

MT/04/14/03/01-2025 හා 2026.01.05 දිනැති ලිපිය මගින් වලංගු බදු ගිවිසුමක් නොමැති ඉඩම් සම්බන්ධයෙන් වලංගු බදු ගිවිසුමක් ඇති කර ගැනීමේ සැලසුම කාරක සභාව වෙත ඉදිරිපත් කර ඇත.

## 11) හච්සන් ටෙලිකොමියුනිකේෂන් ලංකා පුද්ගලික සමාගම හා දුම්රිය දෙපාර්තමේන්තුව එක්ව දුම්රිය මාර්ගයේ ඒකාබද්ධ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීම.

❖ විමර්ශනය කරන ලද දිනය - 2025.05.09

### a. සාකච්ඡා කරන ලද කරුණු (විගණකාධිපති නිරීක්ෂණ අනුව)

හච්සන් කොමියුනිකේෂන් ලංකා පුද්ගලික සමාගමේ යෝජනාවක් මත ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ ඒකාබද්ධ ව්‍යාපෘතියකට හවුල්කරු ලෙස සම්බන්ධ වෙමින්, කොම්පඤ්ඤවීදිය දුම්රිය ස්ථානයේ සිට පේරලන්ද දුම්රිය ස්ථානය දක්වා (පුත්තලම් මාර්ගය කිලෝමීටර් 20 දක්වා) සහ මරදාන දුම්රිය ස්ථානයේ සිට පනාගොඩ දුම්රිය ස්ථානය (කැළණිවැලි මාර්ගය කිලෝමීටර් 30 දක්වා) ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ මාර්ග ඔස්සේ Fiber Cables එළීමේ ව්‍යාපෘතියේ තාක්ෂණ, පාරිසරික සහ මූල්‍ය ක්ෂේත්‍ර ආවරණය වන පරිදි නිසි ශක්‍යතා අධ්‍යනයක් සිදු කර නොතිබීම විධිමත් පරිදි නෛතික අනුමැතීන් ද ලබාගෙන ලිඛිත ගිවිසුම් වලට එළඹීමට පෙර කාර්යයන් ආරම්භ කර තිබීම, මෙම ව්‍යාපෘතිය යටතේ කේබල් එළීමේ කටයුතු සඳහා කැණීම් කටයුතු සිදු කිරීමේදී පවතින දුම්රිය මාර්ගයේ කේබල් පද්ධතියට හානි සිදුවී තිබීම මත සංඥා පද්ධතියට හානි සිදුවීම, එම හානියට අදාළ අලාභයන් මේ දක්වාත් තක්සේරු කර අදාළ ආයතනයෙන් අයකර ගෙන නොතිබීම හා මේ දක්වා ව්‍යාපෘති ප්‍රගතිය වාර්තා වී නොතිබීම ආදී අඩුපාඩු පවතින බව විගණනය විසින් පෙන්වා දෙන ලදී.

### b. ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) / ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්

ව්‍යාපෘතියට විධිමත් ලෙස අනුමැතිය ලැබීමට ප්‍රථම එහි කටයුතු ආරම්භ කර ඇති බව මේ සම්බන්ධයෙන් සිදු කරන ලද විමර්ශනයකින් අනාවරණය වූ බවත් එම නිලධාරීන්ට එරෙහිව විනය ක්‍රියාමාර්ග ගැනීමට ක්‍රියා කරමින් ඇති බවත් එයට අමතරව මරදාන දුම්රිය ස්ථානයේ සිට සිට පනාගොඩ දුම්රිය ස්ථානය දක්වා වූ දෘෂ්‍ය තන්තු (Fiber Cables) එළීමේ ව්‍යාපෘතිය සම්බන්ධයෙන් කමිටුවක් පත්කර විමර්ශනයක් සිදුකර සුදුසු තීරණයකට එළඹීමට නියමිත බවත් දුම්රිය සාමාන්‍යාධිකාරි කාරක සභාව හමුවේ අනාවරණය කල අතර, මෙහි නිත්‍යානුකූල තත්ත්වය පැහැදිලි කළ එහි ප්‍රධාන සංඥා ඉංජිනේරු ප්‍රකාශ කර සිටියේ කේබල් එළීම සඳහා අමාත්‍යාංශ ලේකම් වෙතින් අනුමැතිය ලබා ගෙන ඇති බවයි.

කේබල් පවත්වාගෙන යාමේ නඩත්තු සේවා ගිවිසුම නීතිපති වෙත යොමු කර අනුමැතිය ලබාගැනීමට යම් කාලයක් ගත වූ බවත් එම ගිවිසුම අදාළ වනුයේ

කේබල් භාවිතය ආරම්භ කළ පසු බැවින් හා කේබල් එලීමට එය අදාළ නොවන බැවින් අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය මත කේබල් එලීම සිදු කළ බවත් ප්‍රකාශ කළ ප්‍රධාන සංඥා ඉංජිනේරු කේබල් නඩත්තු කිරීමේ සේවා ගිවිසුම සඳහා මේ වන විට නීතිපති අනුමැතිය ලැබී ඇති බවත් ප්‍රකාශ කළේය. තවද කැණීම් සිදු කිරීමේදී හානි වී ඇති සංඥා කේබල් සඳහා පාඩුව අයකර ගැනීමට කටයුතු කරන බවත් ඒ සඳහා අදාල ආයතනය ඒකඟතාවය පළ කර ඇති බව වැඩිදුරටත් සඳහන් විය.

තවද දුම්රිය දෙපාර්තමේන්තුව සතුව පැවති දෘෂ්‍ය රැහැන් පද්ධතිය වසර 50 කට වඩා පැරණි වූ බැවින් නිරන්තර බිඳවැටීම් වැළැක්වීම සඳහා එය නවීකරණය කිරීමේ දැඩි අවශ්‍යතාවයක් දුම්රිය දෙපාර්තමේන්තුවට පැවති හෙයින් හා හච්සන් සමාගම දෘෂ්‍ය තන්තු කේබල ලබාදීමට හා දුම්රිය දෙපාර්තමේන්තුවට අදාල කේබල් ද ස්ථාපනයට එකඟ වූ බැවින් දෙපාර්තමේන්තුවට වියදමකින් තොරව එම කාර්ය ඉටු කර ගැනීමට මෙමඟින් අවස්ථාව සැලසුන බවද ප්‍රධාන සංඥා ඉංජිනේරු ප්‍රකාශ කළේය.

**c. කාරක සභාවේ නිරීක්ෂණ**

ව්‍යාපෘතිය විධිමත් සැලසුමකින් තොරව ක්‍රියාත්මක කර තිබීම සියලුම ගැටළු වලට හේතු වී ඇති බව කාරක සභාවේ නිරීක්ෂණය විය.

**d. කාරක සභාවේ නිර්දේශ**

හච්සන් ටෙලිකොමියුනිකේෂන් ලංකා පුද්ගලික සමාගම හා දුම්රිය දෙපාර්තමේන්තුව අතර ඇති කර ගැනීමට නියමිත ගිවිසුම සම්බන්ධයෙන් අධ්‍යයනයක් සිදු කර කාරක සභාවට වාර්තා කරන ලෙස අමාත්‍යාංශයේ ප්‍ර.ග.නි වෙත කාරක සභාව නිර්දේශ කළේය.

**e. නිර්දේශ ඉටු කිරීමේ ප්‍රගතිය කාරක සභාව වෙත වාර්තා කිරීම**

මාගේ අංක වි.4373/12/2025(දු.සා.කා) හා 2025/05/27 දිනැති ලිපිය මඟින් අදාළ මූලික විමර්ශන ගොනුව හා චෝදනා කෙටුම්පත්‍රය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත ඉදිරිපත් කිරීම සඳහා ප්‍රවාහන, මහාමාර්ග, වරාය හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය වෙත යොමු කර ඇති බවත්, හච්සන් ටෙලිකොමියුනිකේෂන් ලංකා පුද්ගලික සමාගම විසින් දුම්රිය දෙපාර්තමේන්තුව සතු ඉඩම් තුළ එළා ඇති Fiber Optic Cables වලින් තන්තු 4ක් බදු පදනම මත හච්සන් ටෙලිකොමියුනිකේෂන් ලංකා පුද්ගලික සමාගම වෙත ලබාදීමට බලාපොරොත්තු වන බවත්,

රාජ්‍ය ගිණුම් කාරක සභාව විසින් ලබා දුන් නිර්දේශ සම්බන්ධයෙන් වාර්තා ලබාදීම සඳහා MT/04/14/03/01-2025 හා 2025/05/30 දිනැති ලිපියෙන්

ප්‍රවාහන, මහාමාර්ග, වරාය හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශ ලේකම් විසින් ප්‍රවාහන, මහාමාර්ග, වරාය හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශ අතිරේක ලේකම් (සංවර්ධන), අධ්‍යක්ෂ ජනරාල් (සැලසුම්) හා නීති නිළධාරී ඇතුළත් කමිටුවක් පත් කර ඇති බවත් MT/04/14/03/01-2025 හා 2025/06/04 දිනැති ලිපියෙන් කාරක සභාව දැනුවත් කර ඇත

12) **එන්ජින් සහ බලවේග කට්ටල අවුරුදු 01 සිට අවුරුදු 08 කට ආසන්න කාලයක් රත්මලාන ප්‍රධාන යාන්ත්‍රික ඉංජිනේරු කාර්යාල පරිශ්‍රයේ හා දුම්රිය නැවතුම්පළ වල නවතා තිබීම.**

❖ විමර්ශනය කරන ලද දිනය - 2025.05.09

**a. සාකච්ඡා කරන ලද කරුණු (විගණකාධිපති නිරීක්ෂණ අනුව)**

දෙපාර්තමේන්තුවේ සමස්ත දුම්රිය එන්ජින් සහ බලවේග කට්ටල 267 ක් පවතින අතර ඒවායින් අවුරුදු 40ට වැඩි 90 ක් ද, අවුරුදු 20 ත් 30 ත් අතර 69 ක් ද, අවුරුදු 10 ත් 20 ත් අතර 62 ක් ද අවුරුදු 10 ට අඩු 46 ක් ද වශයෙන් සමන්විත වන අතර එයින් දුම්රිය එන්ජින් 63 ක් සහ බලවේග කට්ටල 40 ක් අවුරුදු 01 සිට අවුරුදු 08 කට ආසන්න කාලයක් රත්මලාන ප්‍රධාන යාන්ත්‍රික ඉංජිනේරු කාර්යාල පරිශ්‍රයේ හා දුම්රිය නැවතුම්පළ වල නවතා ඇති බවත්, සමස්ත මැදිරි 1662 කින් 2024 වර්ෂයේදී මඟී මැදිරි 1475 ක් ධාවනයට යොදාගෙන තිබුණු බවත්, ගැල් 1705 කින් ගැල් 816 ක් ධාවනයේ යොදවා තිබුණු බවත් විගණනය විසින් පෙන්වා දෙන ලදී.

**b. ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) / ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්**

තාක්ෂණික කාර්ය මණ්ඩලයේ හිගකම හේතුවෙන් දෙපාර්තමේන්තුව ඉහත අපහසුතාවයට පත්ව ඇති බවත් එළඹෙන සැප්තැම්බර් මස වන විට කාර්ය මණ්ඩල හිගය අවම කර ගැනීමට කටයුතු කරනු ලබන බවත් ගණන්දීමේ නිලධාරී කාරක සභාව හමුවේ ප්‍රකාශ කළේය.

**c. කාරක සභාවේ නිරීක්ෂණ**

කාර්ය මණ්ඩලයේ හිඟකම අවම කර ගැනීමට ගෙන ඇති පියවර සම්බන්ධයෙන් කාරක සභාව නිලධාරීන්ගෙන් විමසූ අතර, අදාල පියවර හැකි ඉක්මනින් සම්පූර්ණ කළ යුතු බව කාරක සභාවේ නිරීක්ෂණය විය.

**d. කාරක සභාවේ නිර්දේශ**

මෙම විගණන කරුණ සඳහා කාරක සභාව විසින් නිර්දේශයක් ලබා නොදෙන ලදී.

**e. නිර්දේශ ඉටු කිරීමේ ප්‍රගතිය කාරක සභාව වෙත වාර්තා කිරීම**

අදාළ නොවේ.

**13) දුම්රිය තුළ හා දුම්රිය අංගනවල සිදුවන සොරකම්.**

❖ <u>විමර්ශනය කරන ලද දිනය - 2025.05.09</u>

**a. සාකච්ඡා කරන ලද කරුණු (විගණකාධිපති නිරීක්ෂණ අනුව)**

අනුරාධපුර වව්නියාව මාර්ගයේ ධාවනය වූ අධි සුඛෝපභෝගී ඉන්දියානු දුම්රිය ද්විත්වය අනුරාධපුර දුම්රිය ස්ථානයට අයත් අංගනයේ නවතා තිබියදී එහි බැටරි, මෝටර්, වයර් වැනි ඉලෙක්ට්‍රොනික උපාංග සොරකම් කරගෙන යාමට කටයුතු කර ඇති බව විගණනය විසින් පෙන්වා දෙන ලදී.

**b. ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) / ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්**

එක් දුම්රියක් දැනට ධාවනයේ පවතින බවත්, අනෙක් දුම්රිය නැවත ධාවනයට අවශ්‍ය ක්‍රියාමාර්ග ගනිමින් සිටින බවත්, මෙවැනි සිදුවීම් නිරන්තරයෙන් සිදු වන අතර ආරක්ෂක කාර්ය මණ්ඩලය අවම වීම හේතුවෙන් මෙම තත්ත්වය උග්‍ර වී ඇති බවත්, දුම්රිය ආරක්ෂක සේවයේ කාර්ය මණ්ඩලය අළුතින් බඳවා ගැනීමට අවසර ලැබී ඇති බැවින් ඉදිරියේදී මෙම තත්ත්වය යම් දුරකට පාලනය කර ගත හැකි වන බවත් දුම්රිය දෙපාර්තමේන්තුවේ නිලධාරීහු ප්‍රකාශ කළහ.

**c. කාරක සභාවේ නිරීක්ෂණ**

මෙම සිදුවීම සිදු වී වසර 3 ක පමණ කාලයක් ගත වුවද අදාල විමර්ශනයේදී මෙයට වගකිවයුතු පුද්ගලයන් මේ වන තෙක් හඳුනාගෙන නොමැති බව කාරක සභාවේ නිරීක්ෂණය විය.

**d. කාරක සභාවේ නිර්දේශ**

විමර්ශනය සම්බන්ධ වාර්තාවක් හැකි ඉක්මනින් කාරක සභාවට ඉදිරිපත් කරන ලෙස කාරක සභාව අමාත්‍යාංශයේ ප්‍ර.ග.නි. වෙත නිර්දේශ කළාය.

**e. නිර්දේශ ඉටු කිරීමේ ප්‍රගතිය කාරක සභාව වෙත වාර්තා කිරීම**

- මේ සඳහා විමර්ශනයට පත්කර තිබූ කමිටුවට විරෝධතා මතුවීම හේතුවෙන් නව විමර්ශන කමිටුවක් පත් කර ඇති බවත්

- මේ වන විට අදාළ දුම්රිය නඩත්තු කටයුතු අවසන් කර ඇති අතර මෙම සතිය තුළ පරීක්ෂණ ධාවනයකට කටයුතු සූදානම් කර ඇති බවත්

MT/04/14/03/01-2025 හා 2025/06/04 දිනැති ලිපියෙන් කාරක සභාව දැනුවත් කර ඇත.

❖ <u>විමර්ශනය කරන ලද දිනය - 2025.11.27</u>

**a. සාකච්ඡා කරන ලද කරුණු (විගණකාධිපති නිරීක්ෂණ අනුව)**

විමර්ශනය සම්බන්ධව වාර්තාවක් 2025 නොවැම්බර් 14 දින වන විටත් කාරක සභාවට යොමු කර නොතිබුණු බවත්,

මාලිගාවත්ත ජෝන් හොලන්ඩ් අංගනයේ ගාල් කර තිබූ S-13A හා S-5 වර්ගයේ හිතාචි දුම්රිය මැදිරි කට්ටල දිරාපත් වීමට ඉඩ හැරීම හා එම මැදිරි කට්ටල උපාංග සොරා ගැනීම සම්බන්ධයෙන් මූලික විමර්ශනයක් පවත්වා නිර්දේශ ඉදිරිපත් කිරීමට ත්‍රිපුද්ගල කමිටුවක් 2025 මැයි 30 දින පත්කර තිබුණු බවත්,

එම කමිටුව මඟින් එම විමර්ශනය සම්බන්ධයෙන් 2025 නොවැම්බර් 07 දින අතුරු වාර්තාවක් ඉදිරිපත් කර තිබූ අතර ඒ අනුව පහත කරුණු දක්වා තිබුණු බවත්,

S-13A මැදිරිවල අමතර කොටස් සොරකම් කර ඇති බවට 2023 පෙබරවාරි 10 දින එහි අධීක්ෂණ කළමනාකරු වාර්තා කර තිබුණ ද පොලිස් පැමිණිල්ලක් කර නොතිබූ බවත්,

මෙම දුම්රිය මැදිරි නඩත්තු කරන ඉන්දියානු රයිට්ස් සමාගමේ විදුලි ඉංජිනේරුවෙකු වර්ග 05 කට අදාළ අයිතමයන් 35 ක් අස්ථානගතවී ඇති

බවට දැන්වීමෙන් පසු ඒ සම්බන්ධ ස්ථානීය පරික්ෂාවක් කර 2023 මැයි 02 දින දෙමටගොඩ පොලිස් ස්ථානයේ පැමිණිල්ලක් කර තිබූ බවත්,

අධීක්ෂණ කළමනාකරු විසින් 2023 මැයි 19 දින ඉහත අස්ථානගතවීම් වලට අමතරව වර්ග 05 කට අදාළ අයිතමයන් 20 ක් අස්ථානගතවී ඇති බවට දක්වා තිබූ අතර ඒ සම්බන්ධයෙන් එදිනම පොලිස් පැමිණිල්ලක් කර තිබුණි. මෙම අයිතමයන්හි අලාභය රු.11,983,404 ක් ලෙසට ඇස්තමේන්තු කර තිබූ බවත්,

අස්ථානගතවූ අයිතමයන්ට අදාළ අලාභයන් පිළිබඳ සවිස්තරාත්මක වාර්තාවක් මේ වන විටත් සකස් කර නොතිබූ බවත්,

අලාභ හානි සම්බන්ධයෙන් මු.රෙ. 101 සිට 110 ප්‍රකාරව හා අභ්‍යන්තර චක්‍රලේඛ අනුව කටයුතු කර නොතිබූ බව, විගණනය විසින් පෙන්වා දෙන ලදී.

**b. ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) / ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්**

මෙම දුම්රිය අංගන සැමවිටම විවෘතව පවතින බවත්, කාර්ය මණ්ඩලය විශාල වශයෙන් සිටීම හේතුවෙන් බොහෝවිට එකිනෙකා හඳුනාගැනීම පවා අපහසු බවත්, එවැනි තත්ත්වයන් යටතේ විශාල වශයෙන් මෙවැනි සොරකම් සිදුවීමට බොහෝ ඉඩකඩ ඇති බවත්, අමාත්‍යාංශය සමග කළ සාකච්ඡාවේදී මෙහි ආරක්ෂාවට අභ්‍යන්තර ආරක්ෂක අංශයට අමතරව බාහිර පර්ශ්වයක ද සහයෝගය අවශ්‍ය වන බව අවධාරණය කෙරුණු බවත් ඒ අනුව යම් වැඩපිළිවෙලක් දැනට සකස් කරමින් පවතින බවත්, ග.නි. ප්‍රකාශ කළේය.

**c. කාරක සභාවේ නිරීක්ෂණ**

දුම්රිය අංගනය විශාල වුවද, ආරක්ෂාවට ප්‍රමුඛතාවය දියයුතු අංශ සඳහා ආරක්ෂාව දැඩි කිරීමේ ක්‍රමවේදයක් සාදා ගත යුතු බවට කාරක සභාව නිරීක්ෂණය කරන ලදී.

**d. කාරක සභාවේ නිර්දේශ**

සමස්ත දිවයින පුරාම ඇති දුම්රිය අංගනවල අභ්‍යන්තර හා බාහිර ආරක්ෂාව සම්බන්ධයෙන් විධිමත් සැලැස්මක් සකස් කර මසක් ඇතුළත (31.12.2025 වන විට) කාරක සභාවට වාර්තා කිරීමට ප්‍ර.ග.නි./ග.නි. කාරක සභාව සමඟ එකඟ විය.

### e. නිර්දේශ ඉටු කිරීමේ ප්‍රගතිය කාරක සභාව වෙත වාර්තා කිරීම

MT/04/14/03/01-2025 (Vol-ii) හා 2026.02.16 දිනැති ලිපිය මගින් වාර්තාවක් කාරක සභාව වෙත ඉදිරිපත් කර ඇත.

## 14) දුම්රිය සේවාවන් නිරන්තරයෙන් බිඳ වැටීම හා දෙපාර්තමේන්තුවේ අකාර්යක්ෂමතාවය.

❖ විමර්ශනය කරන ලද දිනය - 2025.05.09

### a. සාකච්ඡා කරන ලද කරුණු (විගණකාධිපති නිරීක්ෂණ අනුව)

දුම්රිය දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ මන්දගාමී සහ අකාර්යක්ෂම ස්වභාවය එම දෙපාර්තමේන්තුවේ පරිහානියට හා සේවාවන් බිඳ වැටීමට මූලික වී ඇති බව විගණනය විසින් පෙන්වා දෙන ලදි.

### b. ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) / ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්

ප්‍ර.ග.නි./ග.නි වෙතින් මේ සම්බන්ධව කිසිඳු පැහැදිලි කිරීමක් නොවීය.

### c. කාරක සභාවේ නිරීක්ෂණ

මේ හේතුවෙන් මහජනයා විශාල ලෙස අපහසුතාවයට ලක්වීමත්, රජයට විශාල මූල්‍යමය හානියක් ඇති කිරීමටත් බලපා ඇති බව කාරක සභාව විසින් නිරීක්ෂණය කරන ලදී.

### d. කාරක සභාවේ නිර්දේශ

මෙම විගණන කරුණ සඳහා කාරක සභාව විසින් නිර්දේශයක් ඉදිරිපත් නොකෙරිණි.

### e. නිර්දේශ ඉටු කිරීමේ ප්‍රගතිය කාරක සභාව වෙත වාර්තා කිරීම

අදාළ නොවේ.

❖ <u>විමර්ශනය කරන ලද දිනය - 2025.06.05</u>

**a. සාකච්ඡා කරන ලද කරුණු (විගණකාධිපති නිරීක්ෂණ අනුව)**

2017 වසරේ සිට 2024 දක්වා කාලය තුළ, දුම්රිය ප්‍රමාද වී ධාවනය කළ වාර ගණන සැලසුම් කල වාර ගණනේ ප්‍රතිශතය, 46% සිට 64% ක පරාසයක පවතින බව විගණනය විසින් පෙන්වා දෙන ලදී.

**b. ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) / ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්**

පස් කඳු කඩා වැටීම්, ගස් කඩා වැටීම් හා තාක්ෂණික දෝෂ වැනි දෙපාර්තමේන්තුවට පාලනය කළ නොහැකි මට්ටමේ හේතූන් ද ඇතැම් අවස්ථාවලදී දුම්රිය ප්‍රමාදයට හේතුවී ඇති බවත්, දුම්රිය එන්ජින් හා මාර්ග පද්ධතිය හා බැඳුනු තාක්ෂණික කරුණු හේතුවෙන් දුම්රිය පරිපාලනය ඉතා අසීරු වන බවත්, දුම්රිය රියදුරු ඇතුලු අනෙකුත් සේවකයන්ගේ හිඟය වැනි හේතු බලපාන බවත්, දුම්රිය දෙපාර්තමේන්තුවේ නිලධාරීහු ප්‍රකාශ කළහ.

**c. කාරක සභාවේ නිරීක්ෂණ**

දුම්රිය වාර අවලංගු කිරීම් හා ප්‍රමාද වී ධාවනය කිරීම්, සේවා ඵලදායිතාවයට ඍජු බලපෑමක් ඇති කරන බැවින් එම අඩුපාඩු නිවැරදි කර ගැනීමෙන් ඉදිරියේදී වඩාත් කාර්යක්ෂම දුම්රිය සේවයක් ඇති කිරීමේ අවශ්‍යතාවයක් ඇති බව කාරක සභාවේ මතය විය.

**d. කාරක සභාවේ නිර්දේශ**

1. දුම්රිය ධාවන කාර්යසාධනය (දුම්රිය ධාවන වාර අවලංගු වීම හා ප්‍රමාද වී ධාවනය කිරීම) සම්බන්ධයෙන් පහත වාර්තා ලබා දෙන ලෙස කාරක සභාව විසින් දුම්රිය දෙපාර්තමේන්තුවේ ගණන් දීමේ නිලධාරි වෙත නිර්දේශ කරන ලදි.

   - දෛනිකව සිදුවන දුම්රිය අවලංගුවීම් හා ප්‍රමාදවීම් පිළිබඳ සම්පූර්ණ වාර්තාවක් අමාත්‍යාංශයට ඉදිරිපත් කිරීමට
   - මෙවැනි සිදුවීම්වලදී ඊට හේතු සාධක වූ කරුණු හා නැවත එවැනි සිදුවීම් ඇතිවීම වළක්වා ගැනීමට ගත හැකි ඉදිරි ක්‍රියාමාර්ග ඇතුළත් වාර්තාවක් අමාත්‍යාංශයට ඉදිරිපත් කිරීමට.

- දුම්රිය අවලංගුවීම් හා ප්‍රමාදවීම් නිසා සිදුවන දෛනික පාඩුව පිළිබඳව විගණනයක් සිදුකර ඊට අදාල වාර්තාවක් කාරක සභාව වෙත ඉදිරිපත් කිරීමට.

**2.** දුම්රිය පරිපාලනය පිළිබඳව අධ්‍යනයක් සිදු කර අවශ්‍ය ප්‍රතිව්‍යුහගත කිරීම් සිදු කිරීමට පියවර ගන්නා ලෙස ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා වෙත සහ ගණන්දීමේ නිලධාරී වෙත නිර්දේශ කරන ලදී.

3. පසුගිය වසර 5ක තුළ අත්කර ගත් මූල්‍ය ප්‍රගතිය පිළිබඳව සවිස්තරාත්මක වාර්තාවක් කාරක සභාවට ලැබීමට සලස්වන ලෙස දුම්රිය දෙපාර්තමේන්තුවේ ගණන්දීමේ නිලධාරී වෙත නිර්දේශ කරන ලදී.

**e. නිර්දේශ ඉටු කිරීමේ ප්‍රගතිය කාරක සභාව වෙත වාර්තා කිරීම**

- දෛනිකව සිදුවන දුම්රිය අවලංගුවීම් හා ප්‍රමාදවීම් පිළිබඳව වාර්තාවක් අමාත්‍යාංශයට ඉදිරිපත් කර එහි පිටපතක්,

- වර්තමානයේ ප්‍රමාදයන් හා අවලංගුවීම් අවම කර ගැනීම සඳහා අත්‍යවශ්‍ය තනතුරුවලට අදාල බඳවා ගැනීම් දැනටමත් සිදුකර ඇති බවත්, ඉදිරියටත් ප්‍රමාදයන් හා අවලංගුවීම් අවම කර ගැනීමට දුම්රිය නියාමක, දුම්රිය රියදුරු සහ ඉංජිනේරුවරුන් බඳවා ගැනිමට කටයුතු කරමින් පවතින බවත්,

- දුම්රිය ඇණිය වැඩි කිරීම සඳහා පෞද්ගලික අංශය සමඟ සම්බන්ධව කටයුතු කර ඇති බවත්,

- දෛනික පාඩුව ගණනය කිරීමට අදාළව පරිගණක මෘදුකාංගයක් මේ වන විට සකස් කර ඇති අතර, එහි වැඩිදියුණු කිරීමේ කටයුතු මේ වන විට සිදු කෙරෙමින් පවතින බවත්,

- දුම්රිය පරිපාලනය පිළිබඳව අධ්‍යනයක් සිදු කර අවශ්‍ය ප්‍රතිව්‍යුහගත කිරීම් සම්බන්ධයෙන් 2025/07/14 දින දුම්රිය දෙපාර්තමේන්තුව විසින් පත් කරන ලද කමිටුව විසින් කෙටුම්පත් වාර්තාව සකසා ඉදිරි කටයුතු සඳහා ප්‍රවාහන, මහාමාර්ග හා නාගරික සංවර්ධන අමාත්‍යාංශ ලේකම් වෙත යොමු කිරීමට නියමිතව ඇති බවත්,

- පසුගිය වසර 5ක තුළ අත්කර ගත් මූල්‍ය ප්‍රගතිය පිළිබඳ වාර්තාවත්,

MT/04/14/03/01-2025 හා 2025/11/13 දිනැති ලිපිය මගින් කාරක සභාවට ඉදිරිපත් කර ඇත.

❖ <u>විමර්ශනය කරන ලද දිනය - 2025.11.27</u>

**a. සාකච්ඡා කරන ලද කරුණු (විගණකාධිපති නිරීක්ෂණ අනුව)**

දෛනික පාඩුව ගණනය කිරීම සඳහා Estimation of Financial Losses Due to Train Delays & Cancelation. A Methodological Approach for Sri Lanka Railways නමින් වාර්තාවක් සකස් කර තිබුණි. දිනක දුම්රිය ප්‍රමාද කාලය මිනිත්තු 1000ක් ලෙස ගත්විට දිනක දුම්රිය ප්‍රමාදයේ පාඩුව රු.738,560ක් බවට ගණනය කර තිබුණු බව විගණනය විසින් කාරක සභාවට දන්වන ලදී.

දෛනිකව සිදුවන දුම්රිය අවලංගුවීම් හා ප්‍රමාදවීම් වලට හේතු සාධක වූ කරුණු හා නැවත එවැනි සිදුවීම් ඇතිවීම වළක්වා ගැනීමට ගත හැකි ඉදිරි ක්‍රියාමාර්ග වාර්තාවේ ඇතුළත් නොවුණු බව විගණනය පෙන්වා දෙන ලදී.

**b. ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) / ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්**

- දුම්රිය දෙපාර්තමේන්තුවට 911 දෙනෙකු අලුතින් බඳවා ගැනීම සඳහා අනුමැතිය ලැබී තිබුන ද, ඒ සඳහා ක්ෂණිකව පියවර ගැනීම අපහසු බවත්, අවුරුදු 2-3ක් ඇතුළත බඳවා ගැනීම් සිදුකළ හැකි බවත්, ප්‍රකාශ කළ ප්‍ර.ග.නි විභාග දෙපාර්තමේන්තුව මඟින් පැවැත්වූ විභාගයේදී ප්‍රමාණවත් ලකුණු ලබාගෙන තිබූ පිරිස අවම වීමත්, තාක්ෂණික ශිල්පීන් බොහෝ ප්‍රමාණයක් රට හැර දමා ගොස් තිබීමත්, වැනි හේතූන් නිසා බඳවා ගැනීම් ඉතාම අපහසු වී ඇති බවත්,

- බඳවා ගන්නා පිරිස්වල තාක්ෂණික දැනුම වර්ධනය කිරීම සඳහා දීර්ඝ කාලීන පුහුණු වැඩසටහන්වලට යොමු කළ යුතු බවත්, ඒ සඳහා අවුරුදු 2-3ක් පමණ ගත වන බවත්, දෙමටගොඩ සහ රත්මලාන දුම්රිය අංගනයන් මූලික කරගෙන විශේෂ කාර්යසාධන බලකායක් පත් කර ඉදිරි අවුරුදු 5,10 හා 20 වශයෙන් සැලසුම් දැනටමත් සකස් කරන බවත්,

- නව දුම්රිය එන්ජින් මිලදී ගැනීම, පවතින දුම්රිය එන්ජින් අලුත්වැඩියාව ඉක්මන් කිරීම වැනි කෙටි කාලීන ක්‍රියාමාර්ග සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලිය දැනටමත් ආරම්භ කර ඇති බවත්,

- 1954 සිට මේ දක්වා මෙරටට ආනයනය කරන ලද මුළු දුම්රිය එන්ජින් ප්‍රමාණය 286ක් බවත්, දැනට 277ක් දෙපාර්තමේන්තුව සතුව පවතින බවත්, 12ක් අපහරණය කර ඇති බවත්, එයින් ද ධාවනයට යොදාගත හැකි මට්ටමේ පවතිනුයේ 163ක් බවත්, සාමාන්‍ය දුම්රිය ධාවනයට එන්ජින් 100කට ආසන්න ප්‍රමාණයක් අවශ්‍ය බවත්, කට්ටල 53ක විශාල ප්‍රමාණයේ නඩත්තු පවතින බවත්, සුළු පරිමාණයේ නඩත්තු 58ක් වශයෙන් එන්ජින් 111ක් ධාවනය නොකරන බවත්,

- රියදුරන් 92ක් බඳවා ගැනීමට අනුමැතිය ලැබුණු බවත්, එමඟින් 85ක් දෙසැම්බර් 01 වැනිදා පත්වීම් භාර ගැනීමට නියමිත බවත්,

- දුම්රිය නියාමක පුරප්පාඩු 227ක් සඳහා පැවති විභාගයෙන් 57දෙනෙකු සමත් වුවද, බඳවා ගැනීමේ පටිපාටියට අදාළ අධ්‍යාපන සුදුසුකම් සම්පූර්ණ කර ඇත්තේ 12 දෙනෙකු පමණක් බව සම්මුඛ පරීක්ෂණයේදී හඳුනා ගන්නා ලද බවත්,

- දුම්රිය ධාවන ප්‍රමාදවීම් ක්ෂණිකව දුම්රිය මගීන්ට දැන ගැනීම සඳහා සුදුසු ජංගම යෙදවුමක් (Mobile Application) කිසියම් පුද්ගලික කණ්ඩායමක් විසින් RDMNS App නැමැති යෙදවුම සාදා ඇති බවත්, නමුත් මේ පිළිබඳව වැඩිදුර ඔවුන් සමඟ සාකච්ඡා කිරීමට නොහැකි වූ බවත්, ප්‍ර.ග.නි/ග.නි. ප්‍රකාශ කරන ලදී.

**c. කාරක සභාවේ නිරීක්ෂණ**

නව තාක්ෂණය සමඟ ගැලපීමේදී දෙපාර්තමේන්තුවේ හිමිකමට යටත් ජංගම යෙදවුමක් නොමැති වීම ඉතාම පසුගාමී තත්ත්වයක් බවත්, පුද්ගලික කණ්ඩායමක කොන්දේසිවලට යටත්ව මෙය සිදු නොකර දුම්රිය දෙපාර්තමේන්තුව විසින්ම මෙවැනි කාර්යක්ෂම යෙදවුමක් සාදාගත යුතු බවත්, කාරක සභාවේ මතය විය.

**d. කාරක සභාවේ නිර්දේශ**

දුම්රිය ධාවන ප්‍රමාදවීම් ඉක්මනින් දුම්රිය මගීන්ට දැන ගැනීම සඳහා සුදුසු ජංගම යෙදවුමක් (Mobile Application) සැදීමට අවශ්‍ය මූලික පියවර ගෙන දුම්රිය දෙපාර්තමේන්තුව විසින් නව ජංගම යෙදවුමක් සකස්කර ගන්නේ ද, වෙනත් විකල්ප පවතින්නේ ද යන්න සම්බන්ධව වාර්තාවක් මසක් ඇතුළත (31.12.2025 වන විට) කාරක සභාවට ලබා දීමට ප්‍ර.ග.නි./ ග.නි. කාරක සභාව සමඟ එකඟ විය.

**e. නිර්දේශ ඉටු කිරීමේ ප්‍රගතිය කාරක සභාව වෙත වාර්තා කිරීම**

"ප්‍රවේශ" Smart Ticketing and Seat Reservation (STSR) පද්ධතිය යටතේ මේ වන විට යෙදවුම් 3ක් සංවර්ධනය කරමින් පවතින බවත්, දුම්රිය කාලසටහන සජීවීව දැක බලා ගත හැකි වන පරිදි තොරතුරු ලබා ගත හැකි වන පරිදි එක සංවර්ධනයට කටයුතු කර ඇති බවත්, MT/04/14/03/01-2025 (Vol-ii) හා 2026.02.16 දිනැති ලිපිය මගින් කාරක සභාව වෙත ඉදිරිපත් කර ඇත.

**15) දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩල සංයුතිය.**

❖ විමර්ශනය කරන ලද දිනය - 2025.05.09

**a. සාකච්ඡා කරන ලද කරුණු (විගණකාධිපති නිරීක්ෂණ අනුව)**

2024 දෙසැම්බර් 31 දිනට දුම්රිය දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ මට්ටම, තෘතියික මට්ටම, ද්විතියික මට්ටම, ප්‍රාථමික මට්ටම, අනියම් හා කොන්ත්‍රාත් යන සේවක කාණ්ඩවලට අයත් මුළු පුරප්පාඩු සංඛ්‍යාව 5943ක් වන බව විගණනය විසින් පෙන්වා දෙන ලදී.

**b. ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) / ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්**

දුම්රිය රියදුරු වැනි තනතුරුවල බඳවා ගැනීම් සිදු කළ ද එම නවක සේවකයන් සේවයේ යොදවනු ලබන්නේ වසර 3ක පුහුණු කාලයකට පසුව බවත්, ඒ හේතුවෙන් දැනට දුම්රිය රියදුරු සේවයේ පුරප්පාඩු ද විශාල සංඛ්‍යාවක් පවතින බවත් ඇතැම් සේවාවල සේවක පිරිස් සඳහා අවම සනීපාරක්ෂක පහසුකම් පවා නොමැතිව දැඩි අපහසුතා මධ්‍යයේ සේවය කරනු ලබන බවත් ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා කාරක සභාව හමුවේ ඉදිරිපත් කළේය.

**c. කාරක සභාවේ නිරීක්ෂණ**

ප්‍රාමික මට්ටමේ තනතුරුවල 1474 ක සේවක අතිරික්තයක් පැවතිය ද ඉහළ ශ්‍රේණිවල හා තාක්ෂණික සේවාවල පුරප්පාඩු විශාල සංඛ්‍යාවක් පවතින බවත්, ඉක්මනින් සේවකයන් බඳවාගෙන පුහුණුකිරීම්වලට යොමු කරවිය යුතු බවත් කාරක සභාවේ නිරීක්ෂණය විය.

**d. කාරක සභාවේ නිර්දේශ**

මෙම විගණන කරුණ සඳහා කාරක සභාව විසින් නිර්දේශයක් ඉදිරිපත් නොකෙරිණි.

**e. නිර්දේශ ඉටු කිරීමේ ප්‍රගතිය කාරක සභාව වෙත වාර්තා කිරීම**

අදාළ නොවේ.

## 16) දුම්රිය මාර්ගයේ පවතින ගැටලු

❖ විමර්ශනය කරන ලද දිනය - 2025.05.09

**a. සාකච්ඡා කරන ලද කරුණු (විගණකාධිපති නිරීක්ෂණ අනුව)**

ඉඳුරුව, ගිංතොට, දොඩන්දූව යන පාලම් තුනම වසර 15 - 16ක් පමණ කාලයක් කිසිඳු ගැටලුවකින් තොරව භාවිතා කළද, 2024 වසරේ දී එම පාලම් තුනම නඩත්තු කිරීමට නොහැකි තත්ත්වයට පත්ව ඇති බවත්, කොළඹ කොටුවේ සිට ගාල්ල දුම්රිය මාර්ගයේ M-11, M-10 එන්ජින් සහිත දුම්රිය ඉඳුරුව දුම්රිය ස්ථානයේ සිට ධාවනය තාවකාලිකව නවතා ඇති බවත් අනාවරණය විය.

**b. ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) / ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්**

පාලම් සම්බන්ධයෙන් පේරාදෙණිය විශ්ව විද්‍යායාලයේ සිවිල් ඉංජිනේරු පීඨය මගින් දැනටමත් පරීක්ෂණ කටයුතු සිදු කරමින් පවතින බවත්, ප්‍රධාන මාර්ගයේ එම කටයුතු සිදු කර ගෙන යන බවත් හරස් මාර්ගවල පවතින ගැටළු හේතුවෙන් දුම්රිය රියදුරන් අවධානයෙන් ගමන් කිරීම හේතුවෙන් වේග පාලනයක් සිදු කිරීමට කටයුතු කර ඇති බවත් දුම්රිය දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ඉංජිනේරු ප්‍රකාශ කර සිටියේය.

**c. කාරක සභාවේ නිරීක්ෂණ**

සාමාන්‍යයෙන් පාලම් නිර්මාණය කරනු ලබන්නේ වසර 100 ක කාලයකට වන නමුත් ඉහත කී පාලම් අවුරුදු 24 ක වැනි කාලයක් තුළ දිරාපත් වීම යම් අක්‍රමිකතාවයක් හේතුවෙන් සිදු වූවක් ද යන්න සොයා බැලිය යුතු බව කාරක සභාවේ නිරීක්ෂණය විය.

**d. කාරක සභාවේ නිර්දේශ**

මෙම විගණන කරුණ සඳහා කාරක සභාව විසින් නිර්දේශයක් ඉදිරිපත් නොකෙරිණි.

**e. නිර්දේශ ඉටු කිරීමේ ප්‍රගතිය කාරක සභාව වෙත වාර්තා කිරීම**
අදාළ නොවේ.

**17) පැරණි කැලණිය දුම්රිය පාලම ඉදිකිරීමේ හා ප්‍රතිස්ථාපනය කිරීමේ ව්‍යාපෘතිය.**

❖ <u>විමර්ශනය කරන ලද දිනය - 2025.05.09</u>

**a. සාකච්ඡා කරන ලද කරුණු (විගණකාධිපති නිරීක්ෂණ අනුව)**

ඔස්ට්‍රියානු ආධාර යටතේ යුරෝ. 16,600,000ක් වූ කැලණිය පැරණි දුම්රිය පාලම ඉදි කිරීමේ හා සියලු කාර්යය නිමවා (Turnkey) ප්‍රතිස්ථාපනය කිරීමේ ව්‍යාපෘතියට අනුව, පේරාදෙණිය විශ්ව විද්‍යාලය මඟින් 2002 වර්ෂයේදී සිදු කරන ලද ශක්‍යතා අධ්‍යයන වාර්තාව පරිදි මෙම පාලම 2022 වර්ෂය වන තෙක් භාවිතා කළ හැකි ලෙස වාර්තා කර තිබුණි. පාලම ඉදිරි වසරකින් හෝ දෙකකින් අනිවාර්යයෙන් ඉවත් කළ යුතු වුවත් ඒ සඳහා දුම්රිය දෙපාර්තමේන්තුව හෝ ප්‍රවාහන අමාත්‍යාංශය හෝ සිදු කළ යුතු ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් පෙර සූදානමක් හෝ නොමැති අතර ශක්‍යතා අධ්‍යයනයක් ද සිදු කර නොතිබුණු බව විගණනයේ නිරීක්ෂණය විය.

**b. ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) / ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්**

මෙම ප්‍රතිස්ථාපනය සඳහා රජයෙන් මුදල් වෙන් වී ඇති බවත්, ඉදිරි මාස 3 ඇතුලත CECB ආයතනයෙන් ලබා දෙන සැලැස්ම හා අනෙකුත් ලේඛන සකස් කර ටෙන්ඩර් කැඳවීමට කටයුතු සැලසුම් කර ඇති බවත් දුම්රිය දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ඉංජිනේරු ඇතුළු දෙපාර්තමේන්තු නිලධාරීන්ගේ මතය විය.

**c. කාරක සභාවේ නිරීක්ෂණ**

හැකි ඉක්මනින් මෙහි වැඩ කටයුතු ආරම්භ කර අවදානම අවම කර ගැනීමට කටයුතු බව කාරක සභාවේ නිරීක්ෂණය විය.

**d. කාරක සභාවේ නිර්දේශ**

මෙම විගණන කරුණ සඳහා කාරක සභාව විසින් නිර්දේශයක් ඉදිරිපත් නොකෙරිණි.

**e. නිර්දේශ ඉටු කිරීමේ ප්‍රගතිය කාරක සභාව වෙත වාර්තා කිරීම**

අදාළ නොවේ.

❖ <u>විමර්ශනය කරන ලද දිනය - 2025.06.05</u>

**a. සාකච්ඡා කරන ලද කරුණු (විගණකාධිපති නිරීක්ෂණ අනුව)**

කැලණිය පැරණි දුම්රිය පාලම ප්‍රතිස්ථාපනය කිරීමේ ව්‍යාපෘතියට අනුව, පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ ඉංජිනේරු කණ්ඩායමක් මඟින් 2002 වර්ෂයේදී සිදු කරන ලද ශක්‍යතා අධ්‍යයන වාර්තාව පරිදි මෙම පාලම 2022 වර්ෂය වන තෙක් භාවිතා කළ හැකි ලෙස වාර්තා කර තිබුණු අතර, ඒ අනුව මෙම පාලම ඉදිරි වසරකින් හෝ දෙකකින් අනිවාර්යයෙන් ඉවත් කළ යුතු වුවත් ඒ සඳහා දුම්රිය දෙපාර්තමේන්තුව හෝ ප්‍රවාහන අමාත්‍යාංශය හෝ සිදු කළ යුතු ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් පෙර සූදානමක් හෝ නොමැති අතර, ශක්‍යතා අධ්‍යයනයක් ද සිදු කර නොමැති බව විගණනය විසින් පෙන්වා දෙන ලදී.

**b. ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) / ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්**

මේ සඳහා දේශීය අරමුදල් වෙන් කර ඇති බව නිලධාරීන් ප්‍රකාශ කළහ. Central Engineering Consultancy Bureau (CECB) ආයතනය මගින් මිල කැඳවුමක් දැනට ලබා ගෙන ඇති බවත්, සැලසුම්, ටෙන්ඩර් ලියකියවිලි හා ඉංජිනේරු ඇස්තමේන්තුව මේ වන විට ලැබී ඇති බවත් ඊට අදාල කැබිනට් පත්‍රිකාව දැනටමත් පිළියෙල කර අවසන් බවත් එය එළඹෙන සතිය තුළ කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් කිරීමට හැකි බවත් නිලධාරීහු ප්‍රකාශ කර සිටියහ.

**c. කාරක සභාවේ නිරීක්ෂණ**

2023 හා 2024 යන වර්ෂ 2 සඳහාම භාණ්ඩාගාර මගින් ප්‍රතිපාදන වෙන් කර තිබියදීත් දුම්රිය දෙපාර්තමේන්තුව මේ සඳහා සැලැස්මක් හෝ සාදා නොතිබීම දෙපාර්තමේන්තුවේ අකාර්යක්ෂමතාවය බව කාරක සභාවේ නිරීක්ෂණය විය.

**d. කාරක සභාවේ නිර්දේශ**

මෙදින මෙම විගණන කරුණ සඳහා කාරක සභාව විසින් කිසිඳු නිර්දේශයක් ඉදිරිපත් නොකරන ලදී.

**e. නිර්දේශ ඉටු කිරීමේ ප්‍රගතිය කාරක සභාව වෙත වාර්තා කිරීම**

අදාළ නොවේ.

**18) රත්මලාන ප්‍රධාන යාන්ත්‍රික ඉංජිනේරු කාර්යාල පරිශ්‍රයෙහි ඌන උපයෝජිත යන්ත්‍ර සූත්‍ර හා අබලි ද්‍රව්‍ය ගොඩගැසී පැවතීම.**

❖ විමර්ශනය කරන ලද දිනය - 2025.06.05

**a. සාකච්ඡා කරන ලද කරුණු (විගණකාධිපති නිරීක්ෂණ අනුව)**

i.ජපන් ආධාර යටතේ ඉදි කරන ලද එන්ජින් අලුත්වැඩියාව සහ පරික්ෂා කිරීම සඳහා යොදා ගනු ලබන Testing Room
ii.රුමේනියන් ආධාර යටතේ ඉදි කරන ලද තීන්ත ඉවත් කිරීම සඳහා යොදා ගනු ලබන Shot Blasting Room
iii.සිරස් අතට සවි කර ඇති Press Machine

වැනි දුම්රිය දෙපාර්තමේන්තුව සතු යන්ත්‍ර හා යන්ත්‍රාගාර ඌන උපයෝජනය වන බව නිරික්ෂණය වන බව විගණනය විසින් පෙන්වා දෙන ලදී.

**b. ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) / ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්**

වාර්ෂික අවශ්‍යතා සැලකිල්ලට ගනිමින් දෙපාර්තමේන්තුවට අවශ්‍යතාවයන් සම්පූර්ණ කර ගෙන ඇති බව නිලධාරීහු ප්‍රකාශ කළහ.

**c. කාරක සභාවේ නිරීක්ෂණ**

ඉවත් කළ යුතු බොහෝ පැරණි යන්ත්‍ර සූත්‍ර හා අබලි ද්‍රව්‍ය දුම්රිය වැඩ අංගනවල ගොඩගැසී තිබීම හේතුවෙන් සේවකයන්ට දෛනික සේවා කටයුතු පවත්වා ගෙන යාමට අවශ්‍ය ඉඩ පහසුකම් ප්‍රමාණවත් නොවීම, සුදුසු සේවා පරිසරයක් නොපැවතීම, ප්‍රසම්පාදන ක්‍රියාවලියේ දුර්වලතා පැවතීම, අනවශ්‍ය ලෙස අතිරික්ත තොගයක් පවත්වාගෙන යාම මෙන්ම ඇතැම් යන්ත්‍ර, වගකීම් කාලය (warranty period) ඉක්ම යාමෙන් පසුව භාවිතා කිරීම ආරම්භ කිරීම

හේතුවෙන් ගෙවීමකින් තොරව දෝෂ /අඩුපාඩු නිවැරදි කර ගැනීමට තිබූ අවස්ථාව අහිමිවීම වැනි කරුණු කාරක සභාවට නිරීක්ෂණය විය.

**d. කාරක සභාවේ නිර්දේශ**

මෙම විගණන කරුණ සඳහා කාරක සභාව විසින් නිර්දේශයක් ඉදිරිපත් නොකෙරිණි.

**e. නිර්දේශ ඉටු කිරීමේ ප්‍රගතිය කාරක සභාව වෙත වාර්තා කිරීම**

අදාළ නොවේ.

## 19) M – 11 දුම්රිය එන්ජින් මිලදී ගැනීම හා නඩත්තුව

❖ විමර්ශනය කරන ලද දිනය - 2025.06.05

**a. සාකච්ඡා කරන ලද කරුණු (විගණකාධිපති නිරීක්ෂණ අනුව)**

නිසි සැලැස්මකින් තොරව මෙම M - 11 එන්ජින් මිලදී ගැනීමට කටයුතු කර ඇති බව විගණනය විසින් පෙන්වා දෙන ලදී.

**b. ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) / ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්**

i. 2019 වර්ෂයේ දී M - 11 එන්ජින් 10 ක් මෙරටට ගෙන්වූ බවත් 2020 වසර අවසන් වන විට මෙම එන්ජින් සියල්ල ආනයනය කර අවසන් කළ බවත්,

ii. එක් එන්ජිමක මිල ඇ.ඩො.මි. 4.2 පමණ වන බවත්,

iii. යම් කාලයක් භාවිතා කිරීමෙන් පසු එම එන්ජින් 10 අක්‍රිය තත්ත්වයට පත් වුවද මේ වනවිට එන්ජින් 8 ක් යථාවත් කර ඇති බවත්, ඉතිරි එන්ජින් 2 ද යථාවත් කිරීමට කටයුතු කරමින් පවතින් බවත්,

iv. එහිදී නඩත්තු අත්පොතෙහි (Maintenance Manual) දක්වා ඇති උපදෙස් අනුව Starter Motor 40 ක් ඇණවුම් කරන ලද බවත්, Starter Motor භාවිතා නොකළේ නම් එන්ජිමට වන හානිය හා ඒ හේතුවෙන් අදාළ සමාගම එකී එන්ජින්වල වගකීමෙන් නිදහස් වීමත් සලකා එම ඇණවුම සිදු කරන ලද බවත්,

v. අත්පොතෙහි සඳහන් ක්‍රමවේදයට නඩත්තු කටයුතු සිදු කිරීමෙන් M - 11 එන්ජින් අවුරුදු 18 ක් පමණ භාවිතා කළ හැකි අතර එවැනි නඩත්තු කිරීම්, අලුතින් එන්ජින් මිලදී ගැනීමට වඩා ලාබදායි බවත්,

නිලධාරීහු ප්‍රකාශ කර සිටියහ.

## c. කාරක සභාවේ නිරීක්ෂණ

දුම්රිය උපාංග/යන්ත්‍ර සූත්‍ර පිළිබඳ දත්ත ඇතුළත් යාවත්කාලින තොරතුරු පද්ධතියක් නොතිබීම හේතුවෙන් දුම්රිය දෙපාර්තමේන්තුවේ ගබඩාවල පවතින භාණ්ඩ නිවැරදි ලෙස වාර්තාවීමක් සිදු නොවන බවත් එය නිවැරදි තීරණ ගැනීමට විශාල බාධාවක් වී ඇති බව කාරක සභාවේ නිරීක්ෂණය විය.

## d. කාරක සභාවේ නිර්දේශ

i. M-එන්ජින් 11ක් මිලදී ගැනීමේ ක්‍රියාවලිය පිළිබඳව විමර්ශනයක් සිදුකර වාර්තාවක් කාරක සභාව වෙත ඉදිරිපත් කිරීමට දුම්රිය දෙපාර්තමේන්තුවේ ගණන්දීමේ නිලධාරියා වෙත නිර්දේශ කරන ලදි
ii. මෙම එන්ජින් මිලදී ගැනීමට වැය වූ මුදල හා නඩත්තුව සඳහා මේ වනවිට දරා ඇති වියදම් පිළිබඳව පරික්ෂා කර බලා කාරක සභාව වෙත වාර්තා කිරීමට දෙපාර්තමේන්තුවේ ගණන් දීමේ නිලධාරියා වෙත නිර්දේශ කරන ලදි.

## e. නිර්දේශ ඉටු කිරීමේ ප්‍රගතිය කාරක සභාව වෙත වාර්තා කිරීම.

i. දුම්රිය දෙපාර්තමේන්තුවේ 05 අවුරුදු සැලැස්ම යටතේ හඳුනාගත් අවශ්‍යතාවයක් වන අශ්වබල 2300 – 3200 විදුලි ඩීසල් එන්ජින් 10ක් මිලදීගැනීම ඉන්දියානු ණය පහසුකම (Indian credit line) යටතේ සිදු කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇති බවත්,

ii. තරඟකාරී ක්‍රමය යටතේ ලංසු කැඳවීමට ලංසු ලේඛණ පිළියෙල කර ඇති අතර, ඉන්දියානු ණය පහසුකම යටතේ මිල ගණන් ඉදිරිපත් කරන්නේ සි/ස රයිට් සමාගම විසින් පමණක් බව ඉන්දියානු රජය විසින් දැනුම්දීමත් සමඟ එම ආයතනයෙන් ඉදිරිපත් කළ මිල ගණන් සහ පිරිවිතර දුම්රිය දෙපාර්තමේන්තුවේ අවශ්‍යතාවයට ගැලපෙන පරිදි සකසා ගැනීම සඳහා පැහැදිලිකිරීම් ලබා ගැනිමෙන් පසු ව්‍යාපෘති කමිටුවේ නිර්දේශය සහ අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද කමිටුවේ තීරණය අමාත්‍ය

මණ්ඩලය විසින් අනුමත කිරීමෙන් පසුව අශ්වබල 2300 – 3200 විදුලි ඩීසල් එන්ජින් (M 11) 10ක් මිලදී ගැනීමට කටයුතු කර ඇති බවත්,

iii. එන්ජින් මිලදී ගැනීමට වැය වූ මුදල හා නඩත්තුව සඳහා මේ වනවිට දරා ඇති වියදමත්,

MT/04/14/03/01-2025 හා 2025.11.13 දිනැති ලිපිය මගින් ඉදිරිපත් කර ඇති වාර්තාවේ, ඇමුණුම 09 යටතේ කාරක සභාව වෙත ඉදිරිපත් කර ඇත.

20) **දුම්රිය ආසන වෙන් කර ගැනීම හා සම්බන්ධ මොබිටෙල් ආයතනය සමග පැවති ගිවිසුම.**

❖ <u>විමර්ශනය කරන ලද දිනය - 2025.06.05</u>

**a. සාකච්ඡා කරන ලද කරුණු (විගණකාධිපති නිරීක්ෂණ අනුව)**

M ආසන වෙන් කිරීමේ ක්‍රමය ක්‍රියාත්මක කිරීම සඳහා සීමා සහිත මොබිටෙල් (පෞද්ගලික) සමාගම සහ ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව අතර එළඹ තිබූ ගිවිසුම 2023 දෙසැම්බර් 31 දින අවසන් වී තිබූ නමුත් අදාල ගිවිසුම යාවත්කාලීන කිරීමට හෝ නව ගිවිසුමකට එළඹීමට කටයුතු කර නොතිබියදී M ආසන වෙන් කිරීමට අදාල ගාස්තු මොබිටෙල් ආයතනයේ ගිණුමකට බැර වන බව විගණනය විසින් පෙන්වා දෙන ලදී.

**b. ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) / ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්**

නව ගිවිසුම සඳහා නීතිපති අනුමැතිය ලැබී ඇති බවත්, අදාල ආයතනයට ගිවිසුම් ගත වීමට රුපියල් මිලියන 18ක තැන්පතුවක් අවශ්‍ය බව දන්වා ඇති බවත්, ඔවුන්ගේ එකගත්වය ලැබුණු වහාම ගිවිසුම අත්සන් කිරීමට සූදානම් කර ඇති බවත්ය. එම ආයතනයෙන් මේ දක්වා දුම්රිය දෙපාර්තමේන්තුව වෙත ලැබිය යුතු සියලු මුදල් ලැබී ඇති බවත් ගණන් දීමේ නිලධාරියා ප්‍රකාශ කළේය.

**c. කාරක සභාවේ නිරීක්ෂණ**

දුම්රිය දෙපාර්තමේන්තුව හැකි ඉක්මනින් මේ සම්බන්ධ ගැටලුව විසඳා ගත යුතු බව කාරක සභාවේ නිරීක්ෂණය විය.

**d. කාරක සභාවේ නිර්දේශ**

මෙම විගණන කරුණ සඳහා කාරක සභාව විසින් නිර්දේශයක් ඉදිරිපත් නොකෙරිණි.

**e. නිර්දේශ ඉටු කිරීමේ ප්‍රගතිය කාරක සභාව වෙත වාර්තා කිරීම**

අදාළ නොවේ.

**21) දුම්රිය මගින් හුණුගල් ප්‍රවාහනය සඳහා දුම්රිය එන්ජින් හා රියදුරන් ලබා දීම වෙනුවෙන් අයවිය යුතු මුදල් අයකර ගැනීම.**

❖ විමර්ශනය කරන ලද දිනය - 2025.06.05

**a. සාකච්ඡා කරන ලද කරුණු (විගණකාධිපති නිරීක්ෂණ අනුව)**

දුම්රියෙන් හුණුගල් ප්‍රවාහනය වෙනුවෙන් සියැම් සිටි සිමෙන්ති (ලංකා) සමාගමෙන් 2024 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු බව හිඟ ආදායම් රු.2,187,326ක් වන බව විගණනය විසින් පෙන්වා දෙන ලදී.

**b. ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) / ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්**

පුත්තලම, අරුවක්කාරු ප්‍රදේශයේ පෞද්ගලික සිමෙන්ති නිෂ්පාදනාගාරයකට හුණුගල් ප්‍රවාහනය සඳහා දෙපාර්තමේන්තුවේ දුම්රිය එන්ජින් හා රියදුරන් කුලී පදනම මත ලබා දුන් බවත්, එයට අදාල ගෙවීම් සඳහා ඉන්වොයිස්පත් ඉදිරිපත් කිරීමේදී දුම්රිය එන්ජින් ප්‍රයෝජනයට නොගත් කාල සීමාවන් ද ගෙවීම් සඳහා ඇතුළත් කර තිබීම හේතුවෙන් අදාල සමාගම විසින් එකී මුදල ගෙවීම ප්‍රතික්ෂේප කර තිබූ බවත් පසුව වැඩිපුර අයකර තිබූ මුදල අඩු කර සංශෝධිත ඉන්වොයිස්පත යැවීමෙන් අනතුරුව එම මුදල මේ වනවිට ගෙවා අවසන් කර ඇති බවත් දුම්රිය දෙපාර්තමේන්තුවේ නිලධාරීන් විසින් කාරක සභාව හමුවේ ප්‍රකාශ කරන ලදි.

**c. කාරක සභාවේ නිරීක්ෂණ**

සමාගම වෙත ලබා දෙන දුම්රිය එන්ජින් ආපසු භාරදීමේදී සටහන්ගත නොකිරීම හා නිසි අධීක්ෂණයක් සිදු නොකිරීම මෙම තත්ත්වයට හේතු වී ඇති බව කාරක සභාවේ මතය විය. එමෙන්ම කාලය වාර්තා වන ක්‍රමවේදයක්

සකසා නිවැරදි කාලයන් ඇතුළත් ඉන්වොයිස්පත් අදාල සමාගම වෙත යැවීමේ අවශ්‍යතාවය අවධාරණය කළේය.

**d. කාරක සභාවේ නිර්දේශ**

මෙම විගණන කරුණ සඳහා කාරක සභාව විසින් නිර්දේශයක් ඉදිරිපත් නොකෙරිණි.

**e. නිර්දේශ ඉටු කිරීමේ ප්‍රගතිය කාරක සභාව වෙත වාර්තා කිරීම**

අදාළ නොවේ.

❖ විමර්ශනය කරන ලද දිනය 2025.11.27

**a. සාකච්ඡා කරන ලද කරුණු (විගණකාධිපති නිරීක්ෂණ අනුව)**

අරුවක්කරු දුම්රිය ස්ථානයේ සිට දුම්රියෙන් හුණුගල් ප්‍රවාහනය වෙනුවෙන් සියැම් සිටි සිමෙන්ති (ලංකා) සමාගමෙන් අයවිය යුතු බව හිඟ ආදායම් පිළිබඳව ගත ක්‍රියාමාර්ග හා එහි ප්‍රගතිය පිළිබඳව විගණනය ප්‍රශ්න කරන ලදී.

**b. ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) / ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්**

සිමෙන්ති සංස්ථාව පුද්ගලීකරණය කිරීමත් සමඟම ඊට අයත් දේපල සියල්ල පුද්ගලික ආයතනයක් සතු වූ බවත්, කැබිනට් මණ්ඩල තීරණයකට අනුව දුම්රිය දෙපාර්තමේන්තුව හා පුද්ගලික සිමෙන්ති සමාගම (සියැම් සිටි) ගිවිසුම්ගතව ප්‍රවාහනය කරන හුණුගල් ටොන් 01කට කොළඹ පාරිභෝගික මිල දර්ශකයට අනුරූපව මිල ගණන් නියම කරගෙන අදාල මුදල්, දුම්රිය දෙපාර්තමේන්තුව විසින් අයකර ගන්නා බවත්, දුම්රිය එන්ජින් එම ආයතනයට කුලී පදනම මත ලබා දී එමගින් ද දෙපාර්තමේන්තුව මුදල් උපයා ගන්නා බවත්, දැනට පැහැර හැරීමකින් තොරව එම ආයතනය විසින් දෙපාර්තමේන්තුවට මුදල් ගෙවීම් කර ඇති බවත් දුම්රිය දෙපාර්තමේන්තුවේ නිලධාරීහු ප්‍රකාශ කළහ.

**c. කාරක සභාවේ නිරීක්ෂණ**

දුම්රිය එන්ජින් හා රියදුරන් බදුදීම හා එයින් ආදායම් ලබා ගැනීම පැහැදිලි සැලසුමක් අනුව ක්‍රියාත්මක නොවන බව කාරක සභාව විසින් නිරීක්ෂණය කරන ලදී.

**d. කාරක සභාවේ නිර්දේශ**

දුම්රිය දෙපාර්තමේන්තුවට අයත් දුම්රිය/එන්ජින් බදු දීම, එහි මෙහෙයුම්වලට අදාළ අයකිරීම් හා ආදායම, රේල්පීලි එලීම හා නඩත්තු කටයුතු සිදු කිරීම, සාමාන්‍ය මෙහෙයුම් සිදුවන ආකාරය හා පාලනය සම්බන්ධයෙන් වාර්තාවක් සති 2ක් ඇතුළත (17.12.2025 වන විට) කාරක සභාවට ලබා දීමට ප්‍ර.ග.නි./ග.නි. කාරක සභාව සමඟ එකඟ විය.

**e. නිර්දේශ ඉටු කිරීමේ ප්‍රගතිය කාරක සභාව වෙත වාර්තා කිරීම**

MT/04/14/03/01-2025 හා 2025.12.31 දිනැති ලිපිය මගින් වාර්තාවක් කාරක සභාව වෙත ඉදිරිපත් කර ඇත.

**22) ඇණවුම් කරන ලද භාණ්ඩ නිසි ප්‍රමිතියෙන් හා ඉල්ලුම් කරන ලද ප්‍රමාණ වලින් ලැබී තිබේදැයි සහතික කිරීමකින් තොරව සැපයුම්කරුවන්ට මුදල් ගෙවීම හා අඩුවෙන් ලැබී ඇති භාණ්ඩ සඳහා අයකර ගත යුතු මුදල් අය කර නොගැනීම.**

❖ විමර්ශනය කරන ලද දිනය - 2025.06.05

**a. සාකච්ඡා කරන ලද කරුණු (විගණකාධිපති නිරීක්ෂණ අනුව)**

භාණ්ඩ නිසි ප්‍රමිතියෙන් හා නිවැරදි ප්‍රමාණයන්ගෙන් ලද බවට ගෙවීම් සහතික කරනු ලබන නිලධාරියා විසින් සහතිකවීමෙන් අනතුරුව ගබඩා සැපයුම් සඳහා ගෙවීම් කළ යුතු වුවද, එසේ කිසිදු සහතිකවීමකින් තොරව සපයා නොමැති භාණ්ඩ සඳහා රු. 95,763,117 ක් සැපයුම්කරුවන් හට ගෙවා තිබුණු බවත්, 1980 සිට 2022 දක්වා වූ කාලයට අයත් රු. 84,079,198 ක් ද, 2023 වර්ෂය සඳහා රු. 2,184,279 ක්ද, 2024 වර්ෂය සඳහා රු. 26,138 ක්ද වශයෙන් සපයා නොමැති භාණ්ඩ සඳහා ගෙවා තිබූ රු. 86,289,615 ක් අයකරගෙන නොතිබුණු බව විගණනය විසින් පෙන්වා දෙන ලදී.

**b. ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) / ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම**

අදාල සැපයුම්කරුවන් සමග සාකච්ඡා කරමින් පෙර සිදු කරන ලද මෙවැනි මිලදී ගැනීම් සඳහා මුදල් අයකර ගැනීම හෝ භාණ්ඩ මගින් පියවා ගැනීම ආරම්භ කර ඇති බව නිලධාරීන් විසින් ප්‍රකාශ කරන ලදී. එමෙන්ම මෑත කාලින සැපයුම්කරුවන් සම්බන්ධ කර ගැනීම පහසු වුවත්, 1980 වැනි අතීත කාලවලදී සිදු කරනු ලැබූ මිලදී ගැනීම් සැලකීමේදී ඇතැම් සැපයුම් ආයතන

පවා නොපවතින බැවින්, මෙම කාර්යයේ අපහසුතාවය නිලධාරීන් විසින් පෙන්වා දෙන ලදී.

**c. කාරක සභාවේ නිරීක්ෂණ**

නිසි ප්‍රසම්පාදන ක්‍රමවේදයක් නොපැවතීම මෙයට හේතු වී ඇති බව කාරක සභාවේ නිරීක්ෂණය විය.

**d. කාරක සභාවේ නිර්දේශ**

මෙම විගණන කරුණ සඳහා කාරක සභාව විසින් නිර්දේශයක් ඉදිරිපත් නොකෙරිණි.

**e. නිර්දේශ ඉටු කිරීමේ ප්‍රගතිය කාරක සභාව වෙත වාර්තා කිරීම**

අදාළ නොවේ.

**23) දුම්රිය මගින් භාණ්ඩ ප්‍රවාහනය.**

❖ විමර්ශනය කරන ලද දිනය - 2025.06.05

**a. සාකච්ඡා කරන ලද කරුණු (විගණකාධිපති නිරීක්ෂණ අනුව)**

දුම්රිය මගින් භාණ්ඩ ප්‍රවාහනය කිරීම වෙනුවෙන් 2021 වර්ෂය අවසාන වන විට ආයතන 47 කින් රු.140,784,351 ක් ද, 2020 වර්ෂයේ දුම්රිය බලපත්‍ර හිඟ ආදායම රු.848,334,880 ක් ද, 2020 වර්ෂයේ වෙනත් හිඟ ආදායම් රු.556,205,725 ක් සහ කඩ කාමර හා බඩු ගබඩා 03 ක හිඟ කුලිය රු.36,790,032 ක් ද වශයෙන් රු.1,582,114,988 ක් වූ හිඟ ආදායම් අයකරගෙන නොතිබුණු බවත්, දුම්රිය මඟින් භාණ්ඩ ප්‍රවාහනය කිරීම වෙනුවෙන් 2024 දෙසැම්බර් 31 දිනට ආයතන 31 කින් රු.169,769,006 ක මුදලක් හිඟ වශයෙන් ඇති අතර ඉන් ආයතන 20 කින් ලැබිය යුතු රු.23,457,706 ක මුදල් වර්ෂ 07 සිට 44 දක්වා පැරණි ශේෂයන් වන බවත් විගණනය විසින් පෙන්වාදෙන ලදී.

**b. ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) / ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම**

දුම්රිය දෙපාර්තමේන්තුව මීට වසර 160 පෙර ආරම්භ කරන ලද්දේ භාණ්ඩ ප්‍රවාහනය අරමුණු කරගෙන වුවද 2025 වන විට රටේ සමස්ත භාණ්ඩ ප්‍රවාහනයෙන්, දුම්රිය මගින් සිදු කරනු ලබන්නේ 0.6% ක් පමණක් බවත් කාරක සභාවේදී අනාවරණය කෙරිණි. භාණ්ඩ ප්‍රවාහනයෙහි ඒකාධිකාරයක්

පවත්වා ගැනීමට අතීතයේදී දුම්රිය දෙපාර්තමේන්තුවට හැකි වූ නමුත් වර්තමානයෙදී මාර්ග පද්ධති වල දියුණුව, ලොරිරථ වැනි කාර්යක්ෂම භාණ්ඩ ප්‍රවාහන මාධ්‍ය පැවතීම, දුම්රිය මාර්ග ස්ථාපිතකර ගැනීම තම දෙපාර්තමේන්තුවට සිදු කර ගැනීමට සිදු වීම නිසා එක් ප්‍රවාහන වාරයක් සඳහා අධික මිලක් නියම කිරීමට සිදු වීම වැනි කරුණු හේතුවෙන් දුම්රිය මගින් භාණ්ඩ ප්‍රවාහනය අවම වී ඇති බව දුම්රිය දෙපාර්තමේන්තුවේ නිලධාරීහු ප්‍රකාශ කර හිටියහ.

එමෙන්ම, "ප්‍රීමා" සමාගම මෙන්ම "ඉන්සී සිමෙන්ති" සමාගම සමග දැනටමත් ගිවිසුම් ගතව කටයුතු කරන අතර දැනට ප්‍රවාහනය කරන ඉන්ධන ප්‍රමාණය 40% කින් වර්ධනය කර ගැනීමට ද පියවර ගෙන ඇති බවත්, කන්කසන්තුරය දක්වා ඉන්ධන ප්‍රවාහනයට ද, තඹුත්තේගම සිට කොළඹට කෘෂි ද්‍රව්‍ය ප්‍රවාහනයට ද එම දුම්රියේම කොළඹ සිට තඹුත්තේගම දක්වා පාර්සල් ප්‍රවාහනයට ද අදාළ ව්‍යාපෘතිය වෙනුවෙන් දැනටමත් ගිවිසුම් සකස් කර ඇති බව නිලධාරීහු පැහැදිලි කළහ.

### c. කාරක සභාවේ නිරීක්ෂණ

දුම්රිය මගින් සිදු කරන භාණ්ඩ ප්‍රවාහනය කාර්යක්ෂම කර ගත යුතු බව කාරක සභාවේ නිරීක්ෂණය විය.

### d. කාරක සභාවේ නිර්දේශ

භාණ්ඩ ප්‍රවාහනය සම්බන්ධව සැලසුමක් (Master Plan) සකස් කර කාරක සභාව වෙත ඉදිරිපත් කරන ලෙස දෙපාර්තමේන්තුවේ ගණන් දීමේ නිලධාරියා වෙත නිර්දේශ කරන ලදි.

### e. නිර්දේශ ඉටු කිරීමේ ප්‍රගතිය කාරක සභාව වෙත වාර්තා කිරීම

- භාණ්ඩ ප්‍රවාහනය සම්බන්ධව සැලසුමට (Master Plan) අදාල මූලික පදනම් වාර්තාවත්,

- දැනට වෙයන්ගොඩ බහුවිධ මාධ්‍ය භාණ්ඩ ප්‍රවාහන මධ්‍යස්ථානය හා තඹුත්තේගම සිට කොළඹට එළවළු ප්‍රවාහනය පිළිබඳ ශක්‍යතා අධ්‍යයනයක් සිදු කිරීමට මූලික පියවර අරඹා ඇති බවත්,

- පවතින එන්ජින් හිඟතාවය නිසා දුම්රියෙන් භාණ්ඩ ප්‍රවාහනයට ලැබෙන ඉල්ලීම් පිළිබඳව ඔවුන්ගේ විශ්වාසය රැකෙන පරිදි ප්‍රවාහන කටයුතු භාර ගැනීම අසීරු වී ඇති බවත්, සඳහන් කරමින්,

MT/04/14/03/01-2025 හා 2025.11.13 දිනැති ලිපිය මගින් ඉදිරිපත් කර ඇති වාර්තාවේ, ඇමුණුම 19 යටතේ කාරක සභාව වෙත ඉදිරිපත් කර ඇත.

## 24) දුම්රිය අනතුරු.

- <u>විමර්ශනය කරන ලද දිනය - 2025.06.05</u>

### a. සාකච්ඡා කරන ලද කරුණු (විගණකාධිපති නිරීක්ෂණ අනුව)

දුම්රිය මාර්ග පද්ධතිය ආශ්‍රිතව ප්‍රධාන හා අප්‍රධාන හරස් මාර්ග 1362 ක් පවතින අතර එයින් 185 පෞද්ගලික හරස් මාර්ග ලෙසත් 1177 දුම්රිය දෙපාර්තමේන්තුව විසින් ආරක්ෂා කළ යුතු හරස් මාර්ගයන් ලෙසත් වන අතර, මෙම දුම්රිය හරස් මාර්ගයන් 1177 න් දුම්රිය ගේට්ටු ක්‍රියාත්මක වන හරස් මාර්ග සංඛ්‍යාව 300 ක් ද, දුම්රිය මාර්ග සංඥා ක්‍රියාත්මක වන හරස් මාර්ග සංඛ්‍යාව 438 ක් ද, ප්‍රජා පොලිස් කමිටු සාමාජිකයන් යොදවා ඇති හරස් මාර්ග සංඛ්‍යාව 439 ක් ද වේ. මෙම හරස් මාර්ග 439 න් 200 සඳහා අතින් ක්‍රියාත්මක වන ගේට්ටු සවිකර ඇති අතර ඉතිරි 239 අනාරක්ෂිත තත්ත්වයේ පැවතිය ද ඒ සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. මෙම අනාරක්ෂිත දුම්රිය හරස් මාර්ග පැවතීමත්, හරස් මාර්ග සඳහා යොදවා ඇති ආරක්ෂණ ක්‍රමවේදයන් නිසි පරිදි ක්‍රියාත්මක නොවීමත් හේතුවෙන් 2020 වර්ෂයේ සිට 2024 වර්ෂය දක්වා වූ වර්ෂ 05 ක කාලය තුළ හරස් මාර්ග අනතුරු 385 ක් සිදුවී තිබූ අතර එයින් පුද්ගල මරණ 37 ක් හා තුවාල වීම් 105 ක් වාර්තා වී තිබුණු බව විගණනය විසින් පෙන්වා දෙන ලදී.

### b. ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) / ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්

2025 වසර අවසන් වන විට හරස් මාර්ග 75 ක් ආරක්ෂිත තත්ත්වයට පත් කිරීමට නියමිත බවත් දුම්රිය මාර්ග බාධක, බෙල් හා ලයිට් පද්ධති ස්ථාපිත කිරීම හා දුම්රිය සංඥා පද්ධති මගින් එම හරස් මාර්ග ආරක්ෂා කිරීමට කටයුතු යොදා ඇති බවත් දුම්රිය දෙපාර්තමේන්තුවේ නිලධාරීන් විසින් ප්‍රකාශ කළහ.

### c. කාරක සභාවේ නිරීක්ෂණ

සියදිවි හානි කර ගැනීම් හා දුම්රිය මාර්ගයේ ගමන් කිරීමේදී සිදුවන අනතුරු නිසා වසරකට මරණ 300 ක් පමණ සිදුවන බවත්, අපරික්ෂාකාරී දුම්රිය ධාවනය නිසා සිදු වී ඇති අනතුරු සඳහා වගකිවයුතු පුද්ගලයන් හට අධිභාර පනවා ඇති බවත් ගණන් දීමේ නිලධාරියා ප්‍රකාශ කළේය.

**d. කාරක සභාවේ නිර්දේශ**

1. අනාරක්ෂිත රේල් ගේට්ටු සියල්ලම ආරක්ෂිත තත්ත්වයට පත් කිරීමේ අවශ්‍යතාවය අවධාරණය කළ කාරක සභාව හඳුනාගත් අනාරක්ෂිත දුම්රිය ගේට්ටු පිළිබඳ විස්තර ඇතුළත් ලේඛනයක් කාරක සභාව වෙත ඉදිරිපත් කරන ලෙස දුම්රිය දෙපාර්තමේන්තුවේ ගණන්දීමේ නිලධාරි වෙත නිර්දේශ කරන ලදී.
2. තාක්ෂණික දැනුම ඇති තුන්වන පාර්ශවයක් මඟින් විමර්ශනයක් සිදුකර දුම්රිය අනතුරු අවම කර ගැනීම සඳහා නිර්දේශ සහිත වාර්තාවක් කාරක සභාව වෙත ඉදිරිපත් කිරීමට දෙපාර්තමේන්තුවේ ගණන් දීමේ නිලධාරියා වෙත නිර්දේශ කරන ලදි.

**e. නිර්දේශ ඉටු කිරීමේ ප්‍රගතිය කාරක සභාව වෙත වාර්තා කිරීම**

- අනාරක්ෂිත දුම්රිය හරස්මාර්ග ප්‍රමණය මේ වන විට 429 දක්වා අඩු වී ඇති බවත්,
- මහව /අනුරාධපුර සංඥා ව්‍යාපෘතිය යටතේ නව පද්ධති 46ක් ස්ථාපනය කිරීම සඳහා ගිවිසුම් අත්සන් කර ඇති බවත්,
- දෙපාර්තමේන්තු ව්‍යාපෘති මඟින් නව පද්ධති 15ක් නිම කර ඇති බවත්,
- හරස් මාර්ග සඳහා ප්‍රමුඛතා හඳුනා ගැනීම සඳහා පත් කරන ලද කමිටුව මඟින් අත්‍යාවශ්‍ය ස්ථාන හඳුනා ගන්නා ලද අතර ඉන් ස්ථාන 134ක් 2026/2027 වසර තුළදී ස්ථාපනය කිරීමට කටයුතු යොදා ඇති බවත්,
- මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාවේ සභාපතිතුමා සම්බන්ධ කර ගනිමින් 2025/07/28 දින දුම්රිය සාමාන්‍යාධිකාරී සමඟ සාකච්ඡාවක් පවත්වා ඇති අතර එහිදී එම අදාළ සැලසුම සකස් කිරීම පිළිබඳ නියාමන අදාළ සභාව වෙත පවරා ඇති බවත්, මේ පිළිබඳව දෙපාර්තමේන්තුව නියාමනය කිරීමට පියවර ගන්නා බවට වාචිකව දැනුම් දුන් බවත්,

MT/04/14/03/01-2025 හා 2025.11.13 දිනැති ලිපිය මගින් ඉදිරිපත් කර ඇති වාර්තාවේ, ඇමුණුම 20 හා 21 යටතේ කාරක සභාව වෙත ඉදිරිපත් කර ඇත.

## 25) දුම්රිය දෙපාර්තමේන්තුවේ බඳවා ගැනීම් හා උසස් කිරීම්.

❖ <u>විමර්ශනය කරන ලද දිනය - 2025.06.05</u>

### a. සාකච්ඡා කරන ලද කරුණු (විගණකාධිපති නිරීක්ෂණ අනුව)

ජ්‍යෙෂ්ඨ මට්ටමේ 210 ක් වූ අනුමත සේවක සංඛ්‍යාවෙන් තත්‍ය සේවක සංඛ්‍යාව 128 ක් වීමෙන් පුරප්පාඩු සංඛ්‍යාව 82 ක් හෙවත් සියයට 39 ක් බවත්, තෘතීය මට්ටමේ අනුමත තනතුරු සංඛ්‍යාව 450 ක් වූ අතර තත්‍ය සේවක සංඛ්‍යාව 67 ක් වීමෙන් එහි සේවක පුරප්පාඩු සංඛ්‍යාව 383 ක් හෙවත් සියයට 85 ක ඉතා ඉහළ අගයක් බවත්, ද්විතියික මට්ටමේ 11,339 ක් වූ අනුමත සේවක සංඛ්‍යාවෙන් තත්‍ය සේවක සංඛ්‍යාව 5,928 ක් වීමෙන් පුරප්පාඩු 5,411 ක් හෙවත් සියයට 47 ක් බවත් විගණනය විසින් පෙන්වා දෙන ලදී.

### b. ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) / ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්

සේවකයන් බඳවා ගැනීමට මින් පෙර ඉල්ලීම් කර තිබුණද, මෙම වසරේ මාර්තු මාසය වන තෙක් එයට අනුමැතිය නොලැබුණු බවත්, මේ වන විට තනතුරු බොහොමයක් සඳහා අයදුම්පත් කැඳවා ඇති බවත්, විභාග දෙපාර්තමේන්තුව හා සම්බන්ධ වී, ජුනි හා ජුලි මාස වලදී එම විභාග පැවැත්වීමට කටයුතු සලසා ඇති බවත් දුම්රිය දෙපාර්තමේන්තුවේ නිලධාරීහු ප්‍රකාශ කළහ.

### c. කාරක සභාවේ නිරීක්ෂණ

නිසි කලට තනතුරු සඳහා බඳවා ගැනීම් නොකිරීම දුම්රිය දෙපාර්තමේන්තුවේ අකාර්යක්ෂමතාවයට ප්‍රධානතම හේතුවක් වන බව කාරක සභාවේ මතය විය.

### d. කාරක සභාවේ නිර්දේශ

1. බඳවා ගැනීම් හා උසස් වීම් නිසිකලට ලබා නොදීම නිසා ඇතිව ඇති ගැටලු නිරාකරණය කිරීමට ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා වෙත හා ගණන් දීමේ නිලධාරි වෙත නිර්දේශ කෙරිණි

2. රාජ්‍ය සේවා කොමිෂන් සභාව මගින් ලබා දී ඇති නිර්දේශ/ විනය ක්‍රියාමාර්ග ක්‍රියාත්මක නොකිරීම පිළිබඳව වාර්තාවක් කාරක සභාව වෙත ඉදිරිපත් කිරීමට ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා වෙත හා ගණන් දීමේ නිලධාරියා වෙත නිර්දේශ කෙරිණි.

**e. නිර්දේශ ඉටු කිරීමේ ප්‍රගතිය කාරක සභාව වෙත වාර්තා කිරීම**

- 2025.09.30 වන විට පුරප්පාඩු පිරවීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් තොරතුරු, MT/04/14/03/01-2025 හා 2025.11.13 දිනැති ලිපිය මගින් ඉදිරිපත් කර ඇති වාර්තාවේ, ඇමුණුම 19 යටතේ කාරක සභාව වෙත ඉදිරිපත් කර ඇත.
- රාජ්‍ය සේවා කොමිෂන් සභාව මගින් ලබා දී ඇති තීරණ ක්‍රියාත්මක නොකරන ලද විනය ලිපිගොනු නොමැති බවද දන්වා ඇත.

## 26) අන්තර්ජාලය හරහා දුම්රිය ආසන වෙන්කර ගැනීම.

❖ <u>විමර්ශනය කරන ලද දිනය - 2025.06.05</u>

**a. සාකච්ඡා කරන ලද කරුණු (විගණකාධිපති නිරීක්ෂණ අනුව)**

කොළඹ කොටුව - බදුල්ල දුම්රිය සඳහා විශාල මඟී ඉල්ලුමක් පවතින අතර ඒ සඳහා දිනපතා දුම්රිය 04 ක් ධාවනය කරනු ලබන බවත්, මේ සඳහා සෑම දිනකම අන්තර්ජාලය මගින් ආසන වෙන් කිරීම මාසයකට පෙර දින පෙ.ව. 10.00 ට විවෘත වන අතර තත්පර 01 ක් තුළ ආසන වලින් සියයට 58 කට වැඩි ප්‍රමාණයක් ද පැයක කාලයක් තුළ ආසන සියල්ලම ද වෙන්කර අවසන් වුවද වැඩිවන ඉල්ලුම සපුරාලීමට අදාල යෝජනාවලියක් සකස්කර බලධාරීන්ගේ අවධානයට යොමුකර නොතිබුණු බවත්, එමෙන්ම අන්තර්ජාලය මගින් ආසන වෙන් කිරීමේදී අනුගමනය කළ යුතු කොන්දේසි හා නියමයන්වල 01 වන වගන්තිය අනුව අන්තර්ජාලය මගින් ආසන වෙන් කිරීමේදී එක් හැඳුනුම්පතකට ආසන 05 ක් වෙන් කළ හැකි වුවද නියැදි විගණන පරික්ෂාවේදී එක් හැඳුනුම්පතකට ආසන 24 සිට ආසන 182 ක් දක්වා ආසන වෙන්කර තිබුණි. එමෙන්ම 1041 ඇල්ල ඔඩිසි දුම්රියේ 2024 නොවැම්බර් මස නියැදි පරික්ෂාවට ලක් කළ දින 09 ක් තුළ කොටුව සිට මහනුවර දක්වා පළමු පන්තියේ ආසන 1184 ක් ද, දෙවන පන්තියේ ආසන 1036 ක් ද, තෙවන පන්තියේ ආසන 285 ක් ද වශයෙන් ආසන 2500 ක් හිස්ව ගමන් කර තිබුණු බව විගණනය විසින් පෙන්වා දෙන ලදී.

එමෙන්ම M ආසන වෙන් කිරීමේ ක්‍රමය ක්‍රියාත්මක කිරීම සඳහා සීමාසහිත මොබිටෙල් (පෞද්ගලික) සමාගම සහ ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව අතර එළඹ තිබූ ගිවිසුම 2023 දෙසැම්බර් 31 දින අවසන් වී තිබූ නමුත් අදාල ගිවිසුම යාවත්කාලීන කිරීමට හෝ නව ගිවිසුමකට එළඹීමට කටයුතු කර නොතිබියදී M ආසන වෙන් කිරීමට අදාල ගාස්තු මොබිටෙල් ආයතනයේ ගිණුමකට බැර වන බව නිරීක්ෂණය වන බවද විගණනය පෙන්වා දෙන ලදී.

### b. ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) / ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්

ඇතැම් සංවිධානාත්මක පුද්ගලයන් හා ආයතන විසින් මෙම ටිකට්පත් මිලදී ගෙන නැවත වැඩි මුදලකට අලෙවි කිරීම සිදු කරන බව හඳුනාගැනීමෙන් පසු ඒ සම්බන්ධයෙන් පොලිස්පතිට පැමිණිලි කර ඇති බව ගණන් දීමේ නිලධාරියා ප්‍රකාශ කළේය.

එමෙන්ම අධික ඉල්ලුමක් ඇති දුම්රිය ගමන් මාර්ග සඳහා අමතර දුම්රිය ගමන් වාර හඳුන්වා දීම දැනටමත් සිදු කර ඇති බවත්, දුම්රිය දෙපාර්තමේන්තු නිලධාරීහු ප්‍රකාශ කළහ. ටිකට්පත් සඳහා refund policy වෙනස් කිරීමට කටයුතු කිරීම, එක් හැඳුනුම්පත් අංකයකින් වෙන් කළ හැකි ආසන සංඛ්‍යාව සීමා කිරීම, OTP ක්‍රමයක් හඳුන්වා දීම මගින් වෙන් කරවාගත හැකි ආසන සීමා කිරීම, ඇල්ල-ඔඩිසි දුම්රියේ ආසනයක මිල තීරණය කිරීමේදී, ප්‍රධාන ගමනාන්තයට යාම සහ නැවත පැමිණීම යන ගමන් වාර දෙකම සලකා බලා මිල නියමකිරීම වැනි ක්‍රියාමාර්ග හේතුවෙන් දුම්රිය දෙපාර්තමේන්තුවට පාඩුවක් සිදු වී නොමැති බව නිලධාරීහු ප්‍රකාශ කර සිටියහ.

### c. කාරක සභාවේ නිරීක්ෂණ

දෙපාර්තමේන්තුව මගින් ගන්න ක්‍රියාමාර්ග සාධනීය බවත්, මෙමගින් දුම්රිය දෙපාර්තමේන්තුව වෙන පාඩුවක් සිදුවී නැති බවත් කාරක සභාවේ නිරීක්ෂණය විය.

### d. කාරක සභාවේ නිර්දේශ

මෙම විගණන කරුණ සඳහා කාරක සභාව විසින් නිර්දේශයක් ඉදිරිපත් නොකෙරිණි

### e. නිර්දේශ ඉටු කිරීමේ ප්‍රගතිය කාරක සභාව වෙත වාර්තා කිරීම

අදාළ නොවේ.

**27) හචිසන් ටෙලිකොමියුනිකේෂන් ලංකා පුද්ගලික සමාගම හා දුම්රිය දෙපාර්තමේන්තුව එක්ව දුම්රිය මාර්ගයේ ඒකාබද්ධ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීම.**

❖ <u>විමර්ශනය කරන ලද දිනය - 2025.06.05</u>

**a. සාකච්ඡා කරන ලද කරුණු (විගණකාධිපති නිරීක්ෂණ අනුව)**

හචිසන් කොමියුනිකේෂන් ලංකා පුද්ගලික සමාගමේ යෝජනාවක් මත ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ ඒකාබද්ධ ව්‍යාපෘතියකට හවුල්කරු ලෙස සම්බන්ධ වෙමින්, කොම්පඤ්ඤවීදිය දුම්රිය ස්ථානයේ සිට පේරලන්ද දුම්රිය ස්ථානය දක්වා (පුත්තලම් මාර්ගය කිලෝමීටර් 20 දක්වා) සහ මරදාන දුම්රිය ස්ථානයේ සිට පනාගොඩ දුම්රිය ස්ථානය (කැළණිවැලි මාර්ගය කිලෝමීටර් 30 දක්වා) ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ මාර්ග ඔස්සේ Fiber Cables එළීමේ ව්‍යාපෘතියේ තාක්ෂණ, පාරිසරික සහ මූල්‍ය ක්ෂේත්‍ර ආවරණය වන පරිදි නිසි ශක්‍යතා අධ්‍යනයක් සිදු කර නොතිබීම විධිමත් පරිදි නෛතික අනුමැතීන් ද ලබාගෙන ලිඛිත ගිවිසුම්වලට එළඹීමට පෙර කාර්යයන් ආරම්භ කර තිබීම. මෙම ව්‍යාපෘතිය යටතේ කේබල් එළීමේ කටයුතු සඳහා කැණීම් කටයුතු සිදු කිරීමේදී පවතින දුම්රිය මාර්ගයේ කේබල් පද්ධතියට හානි සිදුවී තිබීම මත සංඥා පද්ධතියට හානි සිදුවීම, එම හානියට අදාළ අලාභයන් මේ දක්වාත් තක්සේරු කර අදාළ ආයතනයෙන් අයකර ගෙන නොතිබීම හා මේ දක්වා ව්‍යාපෘති ප්‍රගතිය වාර්තා වී නොතිබීම ආදී අඩුපාඩු නිරීක්ෂණය වන බව විගණනය විසින් පෙන්වා දෙන ලදී.

**b. ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) / ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්**

එකී ව්‍යාපෘති හිටපු ලේකම්වරුන්ගේ අනුමැතිය සහිතව නිවැරදි ක්‍රියාපටිපාටියකට අනුව ක්‍රියාත්මක කර ඇති බවත්, කැළණිවැලි මාර්ගයේ ව්‍යාපෘතිය ඉදිරියට ක්‍රියාත්මක කරන්නේද නැද්ද යන්න සම්බන්ධයෙන් කඩිනමින් තීරණයකට එළඹිය යුතු බවත් ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා ප්‍රකාශ කළේය.

**c. කාරක සභාවේ නිරීක්ෂණ**

මෙම ව්‍යාපෘතියෙන් දුම්රිය දෙපාර්තමේන්තුවට ලබාගත හැකි ප්‍රතිලාභ රාශියක් ඇති බව කාරක සභාවේ නිරීක්ෂණය විය.

**d. කාරක සභාවේ නිර්දේශ**

පුත්තලම මාර්ගයේ ව්‍යාපෘතිය හැකි ඉක්මනින් අවසන් කිරීමට ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා වෙත හා ගණන් දීමේ නිලධාරියා වෙත නිර්දේශ කෙරිණි

**e. නිර්දේශ ඉටු කිරීමේ ප්‍රගතිය කාරක සභාව වෙත වාර්තා කිරීම**

- කිලෝමීටර 50 වූ මුළු ව්‍යාපෘතියෙන් පුත්තලම් මාර්ග කොටස ලෙස කොම්පඤ්ඤවීදිය සිට පේරලන්ද දක්වා කිලෝමීටර් 20 ක්ද මරදාන සිට පනාගොඩ දක්වා කැලණිවැලි මාර්ග කොටස ලෙස කිලෝමීටර් 30ක්ද කේබල් එළිය යුතු අතර එහි පුත්තලම් මාර්ග කොටස පේරලන්ද සිට දෙමටගොඩ දක්වා සිදුකර තිබුණු බවත්,

- ප්‍රවාහන, මහාමාර්ග හා නාගරික සංවර්ධන අමාත්‍යාංශ ලේකම්ගේ අංක: MT/04/14/03/01-2025 හා 2025/10/07 දිනැති ලිපියෙන් (ඇමුණුම 25 - I) පුත්තලම් මාර්ග කොටස පේරලන්ද සිට දෙමටගොඩ දක්වා කොටස අවසන් කිරීමට අනුමැතිය ලැබී ඇති බවත්, ඒ අනුව එම කොටස අවසන් කරන ලෙස හචිසන් ටෙලිකොමියුනිකේෂන් ලංකා පුද්ගලික සමාගම වෙත අංක: T.03/DPC/Misc/2025 හා 2025/10/27 දිනැති ලිපිය (ඇමුණුම 25 - II ) මගින් දන්වා ඇති බවත්,

MT/04/14/03/01-2025 හා 2025.11.13 දිනැති ලිපිය මගින් ඉදිරිපත් කර ඇති වාර්තාවේ, ඇමුණුම 19 යටතේ කාරක සභාව වෙත ඉදිරිපත් කර ඇත.

## 28) දුම්රිය ගමනාගමනය හා දුම්රිය ඇතුළත පහසුකම්.

❖ <u>විමර්ශනය කරන ලද දිනය - 2025.06.05</u>

**a. සාකච්ඡා කරන ලද කරුණු (විගණකාධිපති නිරීක්ෂණ අනුව)**

2025 ජනවාරි 25 දින නියමිත කාල සටහන අනුව මඩකලපුවේ සිට කොළඹ බලා ධාවනය වීමට තිබූ දුම්රිය, දුම්රිය නියාමකවරුන් දෙදෙනාට නවාතැන් පහසුකම් ප්‍රමාණවත් නොවීම මත දුම්රිය ධාවනය කර නොතිබුණු බවත්, නියාමකවරුන් දෙදෙනෙකුට එක් කාමරයක් ලෙස ඔවුන්ට නවාතැන් පහසුකම් සපයා තිබුණු බවත්, එමෙන්ම නියමිත කාල සටහනක් නොමැතිව ජනවාරි 26 දින එම දුම්රිය මඟීන් රහිතව කොළඹට ධාවනය කර තිබුණු බවත්, දුම්රිය අවලංගු කිරීම මත රු.600,000 ක ආදායමක් අහිමිවී තිබූ අතර නියමිත දින නියමිත කාලසටහන අනුව දුම්රිය ධාවනය නොවීම හේතුවෙන් දුම්රිය දෙපාර්තමේන්තුවට, මඟීන් හා අනෙකුත් පාර්ශවයන්ට සිදුවී ඇති

හානිය/බලපෑම අධ්‍යනය කර ඊට අදාලව ගත යුතු ක්‍රියාමාර්ග දෙපාර්තමේන්තුව විසින් ගැනීමටත්, ඉදිරියේදී මෙවැනි තත්ත්වයන් ඇති නොවීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණු බව විගණනය විසින් නිරික්ෂණය කරන ලදී.

**b. ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) / ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්**

නව දුම්රිය කට්ටල මිලදී ගැනීමේදී වැසිකිලි පද්ධති සහිත කට්ටල ඇනවුම් කර ඇති බවත්, දැනට පවතින දුම්රිය වැසිකිලි පද්ධති මහනුවර, නානුඔය, මහව, අනුරාධපුර යන දුම්රිය ස්ථාන වලදී පිරිසිදු කිරීමට අවශ්‍ය ප්‍රතිපාදන දැනටමත් ලබා දී ඇති බවත් දෙපාර්තමේන්තුවේ නිලධාරීන් විසින් ප්‍රකාශ කරන ලදී.

**c. කාරක සභාවේ නිරීක්ෂණ**

පහසුකම් සැලසීම තුලින් වැඩි මගීන් ප්‍රමාණයක් දුම්රිය මගී ප්‍රවාහන ක්‍රමවේදයට ආකර්ෂණය කර ගැනීමට හැකි බවත්, එමගින් ආදායම වැඩි කර ගත හැකි බවත් කාරක සභාවේ මතය විය.

**d. කාරක සභාවේ නිර්දේශ**

1. අවන්හල්, නවාතැන්, සනීපාරක්ෂක පහසුකම් විධිමත් ආකාරයට සංවර්ධනය කළ හැකි පරිදි ටෙන්ඩර් පටිපාටිය ක්‍රියාත්මක කිරීම හා එම පටිපාටිය අධීක්ෂණය කිරීමට ක්‍රමවේදයක් සකස් කර ඉදිරිපත් කිරීමට දුම්රිය දෙපාර්තමේන්තුවේ ගණන් දීමේ නිලධාරියා වෙත නිර්දේශ කරන ලදි.

2. වැසිකිලි අපද්‍රව්‍ය මාර්ගයට නොවැටෙන ලෙස එක්රැස් කර බැහැර කරවීමට, ක්‍රමවේදයක් හැකි ඉක්මනින් සකස් කිරීමට දුම්රිය දෙපාර්තමේන්තුවේ ගණන් දීමේ නිලධාරියා වෙත නිර්දේශ කරන ලදි.

3. දුම්රිය දෙපාර්තමේන්තුව සතුව ඇති සම්පූර්ණ එන්ජින් ගණන සහ ඒවායේ වර්තමාන තත්ත්වය, නැවත භාවිතා කිරීමේ හැකියාව ආදී තොරතුරු ඇතුළත් වාර්තාවක් කාරක සභාවට ඉදිරිපත් කිරීමට දුම්රිය දෙපාර්තමේන්තුවේ ගණන් දීමේ නිලධාරියා වෙත නිර්දේශ කරන ලදි.

**e. නිර්දේශ ඉටු කිරීමේ ප්‍රගතිය කාරක සභාව වෙත වාර්තා කිරීම**

- අවන්හල්, නවාතැන් පහසුකම් හා සනීපාරක්ෂක පහසුකම් සම්බන්ධ වාර්තාවක් MT/04/14/03/01-2025 හා 2025.11.13 දිනැති ලිපිය මගින්

ඉදිරිපත් කර ඇති වාර්තාවේ, ඇමුණුම 19 යටතේ කාරක සභාව වෙත ඉදිරිපත් කර ඇත.